ජාත්‍යන්තර
ජනමාධ්‍යවේදීන්ගේ
සම්මේලනය

ජැකලීන් පාර්ක්
අයි.එෆ්.ජේ ආසියා පැසිෆික් අධ්‍යක්ෂිකා,
එලිසබෙත් කොස්තා
ප්‍රධාන ලේකම්වරිය

# ශ්‍රී ලංකා තත්ත්ව වාර්තාව

## මාධ්‍ය නිදහස පශ්චාත් යුද්ධ දේශපාලනයේ නොසැලකෙන පැතිමානයකි

ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය (අයි.එෆ්.ජේ.) මෑත දී ශ්‍රී ලංකාවෙහි සිය හවුල්කාර සංවිධාන සමඟ කළ සාකච්ඡාවන්ගෙන් පෙනී ගියේ මාධ්‍ය නිදහස එරට පශ්චාත් යුද්ධ දේශපාලනයේ නොසළකා හැර ඇති පැතිමානයක් බවයි. 2009 මැයි මාසයේ දී ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය අවසන් වීමත් සමඟ ඇතිවූ ප්‍රථම බලාපොරොත්තු වියැකී යාම විසින් සනිටුහන් කරන අපේක්ෂා බිඳවැටීමේ පුළුල් පරාසය තුළ රටෙහි මාධ්‍ය වෘත්තිකයින් බැරෑරුම් දුෂ්කරතාවයන්ට මුහුණ දී සිටිති. බලහත්කාරයේ විවෘත ස්වරූපයන් යුද්ධ කාලයේදී මෙන් කැපී පෙනෙන්නේ නැත. එසේ නමුත් විසංවාදය මැඩලීම පිනිස දේශපාලන සහ මූල්‍ය බලය උපයෝගී කර ගැනෙන, මාධ්‍ය වටපිටාවෙහි ගොදුරක් බවට පත්වූ කතා කිරීමේ නිදහස ඇද වැටෙමින් පවතින්නේ යැයි බියක් තිබේ.

රටෙහි විශ්ව විද්‍යාල තෙමසක් වසා දැමීමට බල කෙරුණු ආචාර්යවරුන්ගේ වර්ජනයෙහි දී මෙම සීමාකාරී අලුත් නැඹුරුව පෙනී ගියේ ය. වර්ජනයේ ප්‍රකාශිත අරමුණ වූයේ වැටුප් සහ සේවා තත්ත්වයන්හි පහළ වැටීම ය. එමෙන්ම එහි පසුබිම් හේතුව වූයේ කලකට පෙර ඉහළ සැළකීමක් ලද ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය ක්‍රමයෙන් විනාශ වී යෑමයි. වර්ජනය තෙවන මාසය කරා ඇදීයත්ම රාජ්‍ය මාධ්‍ය මත ඇති අධිකාරය යොදා ගනිමින් ආණ්ඩුවේ ප්‍රකාශකයෝ වර්ජනය ප්‍රජාතන්ත්‍රවාදීව තොරාපත් රජය පෙරළීමට සහ විසිපස් වසරක් පැවැති සිවිල් යුද්ධය අවසන් කිරීමෙන් ලද තීරණාත්මක ජයග්‍රහණය ආපසු හැරවීමට දරනු ලබන ප්‍රයත්නයක් යැයි චෝදනා කළහ. විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සම්මේලනයේ (පූටා) නායකත්වය හෙබවූ ඉහළ පිළිගැනීමක් ඇති ශාස්ත්‍රඥයින් එම කුමන්ත්‍රණයේ වගකිවයුත්තන් ලෙස නම් කරන ලදී. පූටා උද්ඝෝෂණය පෘතුල ජන සහයෝගයක් දිනා ගත්තේ ය. එමෙන්ම කිසිම අරුතකින් එය පශ්චාත් යුද්ධ ශ්‍රී ලාංකික සමාජයේ මතුපිට නිහඬතාවය අවුල් කර විරෝධතා ඉස්මතු කිරීමක් ඉලක්ක කර තිබුණේ නැත. එකතැන පල්වෙන වැටුප් සම්බන්ධයෙන් මෑත දී රජයේ විදුලි බල මණ්ඩලයේ සේවක පිරිස් ද සිය අසහනය ප්‍රකාශ කළහ. එම ක්ෂේත්‍රයෙහි ඇතිවූ වැඩ වර්ජන විසින් රටෙහි යම් යම් ප්‍රදේශයන්හි විදුලි බලය නැතිව ගියේ ය. සමහර නිරීක්ෂකයින් කල්පනා කරන්නේ ජනාධිපති රාජපක්ෂ රටෙහි ආර්ථික සහ මූල්‍යමය ශක්‍යතාවයන් ඔරොත්තු නොදෙන තරමට දිගාදිමින් වරාය සහ අධිවේගී මාර්ග වැනි මහා පරිමාණ යටිතල ව්‍යාපෘතීන්හි ආයෝජනය කරමින් සිටින බවයි. මධ්‍යම බැංකුව යටතේ පවත්වා ගනිමින් දීර්ඝ කාලීනව සුරක්ෂිතව පවත්වා ගත යුතු සිය විශ්‍රාම අරමුදල් රජයේ බලපෑම මත බැංකු වැනි රජයේ තීරණාත්මක ආයතනයන්හි කොටස් මිලදී ගැනීමට යොදවන බව මානව හිමිකම් නීතිවේදීහු සහ සිවිල් සමාජ ක්‍රියාකාරී පිරිස් කල්පනා කරති. ආණ්ඩුව අතෙහි වර්ධනය වන බල සංකේන්ද්‍රණය ආර්ථික බලය ද ලබා ගැනීමෙන් වඩා ඉහළ යයි. ආණ්ඩුවේ වෙළඳ දැන්වීම් ලබා දීම කරගෙන යන්නේ කර්තෘ න්‍යාය පත්‍රය මත

බලපෑමේ නිශ්චිත අරමුණ ඇතිව ය. පාලක පක්ෂයේ අවසාන තෙරපුම ලෙස ක්‍රියාකරන මූල්‍ය බලය, මාධ්‍ය ආයතන මිලදී ගැනීම පිණිස ද යෙදවෙයි.

මාධ්‍ය භූමිය තවමත් විවාදාත්මක ය. දෙමළ ප්‍රජාවට සාධාරණ හඬක් ලබා දෙන ජනමාධ්‍ය විවෘතව ම ත්‍රස්තවාදීන්ගේ සහායකයින් ලෙස හෝ ද්‍රෝහීන් ලෙස චෝදනා ලබයි. පවත්නා තීරණාත්මක වාර්ගික බෙදීම හරහා ඉදිරි පිම්මක් පැන සැබෑ විවිධත්වය ඇති කිරීමට අසමත්වීමේ හොඳම නිදසුන ලෙස මාධ්‍යයෙහි රාජ්‍ය පාලනය පවතී. හිමිකාරත්වය, අන්තර්ගතය තීරණය කිරීම මෙන්ම වෙළඳ දැන්වීම් පළ කිරීම යන දෙ අංශයෙන්ම රාජ්‍ය පාලනය විශාල ය.

## මාධ්‍ය නිදහස ප්‍රතිසංධානයේ අත්‍යවශ්‍ය සංඝටකයක් ලෙස

2012දී ශ්‍රී ලංකා ආණ්ඩුව ජාතික ප්‍රතිසන්ධානය සඳහා වූ කොමිසමක නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස ජාතික ක්‍රියාකාරී සැලැස්මක් ප්‍රකාශයට පත් කළා ය. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම (එල්.එල්.ආර්.සී.) යැයි නම් කරන ලද එය පත් කරන ලද්දේ යුද්ධාවසානයෙන් වසරකට පසු ය. කොමිසම සම්බන්ධයෙන් මුලදී ඇති වූ සැක නොසළකා එහි සාක්ෂි විමසීම් හි දී යුද්ධයේ අන්තිම වසරවල දී උතුරෙහි සිවිල් ජනයා විඳි දුක් ගැහැට පිළිබඳ වැදගත් කරුණු ඉස්මතු කර ගැනීමට එය සමත් වූවා ය. සමහර විට එම තොරතුරු සම්පූර්ණ නැතිවා වන්නට පුළුවන. 2011 නොවැම්බරයේ දී ඉදිරිපත් කරන ලද පිටු 400ක් තරම් වන එම වාර්තාවෙහි ජනමාධ්‍ය සම්බන්ධයෙන් තිබුණේ පිටු දෙකකි. එසේ නමුත් එය විසින් මාධ්‍ය නිදහස අරභයා කරන ලද නිර්දේශ ඉතා ඉහළ වැදගත්කමකින් යුතු ය.

කොමිසම ජනමාධ්‍යවේදීන්ට සහ මාධ්‍ය ආයතනයන්ට පහරදීම වැළැක්වීමට අවශ්‍ය පියවර ද අතීතයෙහි සිදු වූ එවැනි සිදුවීම් පරීක්ෂා කිරීම ද වරදකරුවන්ට දඬුවම් කිරීම ද නිර්දේශ කරන ලදී. ජන මාධ්‍යවේදීන්ට නිදහසේ සංචරණය කිරීමේ අයිතිය මෙන්ම තොරතුරු නිදහසේ පනතක් පිහිටුවීමට ද එය නිර්දේශ කළා ය. ජනමාධ්‍ය නිදහස සම්බන්ධයෙන් එල්.එල්.ආර්.සී. නිර්දේශ උපුටා දැක්වීම තරම් යෝග්‍ය යː

> *''මූලික මානව හිමිකමක් ලෙස විශ්වමය වශයෙන් සැළකෙන අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ තොරතුරු දැන ගැනීමේ නිදහස ප්‍රති සන්ධානයෙහිලා තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරයි. එබැවින් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මයන්ට සහ අදාළ මූලික අයිතිවාසිකම් බැඳීම් අනුව යමින් මාධ්‍ය නිදහස ඉහළ නැංවිය යුතු ය. මන්ද යත් මාධ්‍ය නිදහස මත පැනවෙන ඕනෑම සීමා කිරීමක් විසින් නිසගයෙන්ම ජන වාර්ගික කණ්ඩායම් තුළ මෙන්ම ඒවා අතර අවිශ්වාසයේ සහ භීතියේ පරිසරයක් ඇති වන නිසා ය.*
>
> *එවැනි තත්ත්වයක් විසින් කෙරීගෙන යන ප්‍රතිසන්ධානය මත සීමා පැනවෙන පරිදි තොරතුරු සහ අදහස් හුවමාරුව වැළකෙනවා ඇත.*
>
> *කොමිසම පහත සඳහන් නිර්දේශ අවධාරණය කරයි.*

*අ. ජනමාධ්‍යවේදීන්ට සහ මාධ්‍ය ආයතනයන්ට හිරිහැර පැමිණවීම සහ ප්‍රහාර එල්ල කිරීම වැළැක්වීමට අවශ්‍ය සියළු පියවර ගත යුතු ය.*

*ආ. අපරාධ යුක්ති ක්‍රියාදාමය ගැන මහජන විශ්වාසය ඇතිවන පරිදි එවැනි අපරාධ සම්බන්ධයෙන් තදබල දඬුවම් පැනවීමට පියවර ගෙන එවැනි සිදුවීම් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට, නඩු පැවැරීමට සහ නඩු අවසන් කිරීමට පියවර ගත යුතු ය.*

*ඇ. සිදුව ඇති එවැනි අනීතික සිදුවීම් නිසි ලෙස පරීක්ෂා කළ යුතු ය. එවැනි සිදුවීම් විසින් යුක්තිය පසිඳලීම පිළිබඳ මහජන විශ්වාසය පළුදු කරයි. එබැවින් පරීක්ෂණ වහා අවසන් කොට වරද කරුවන් නීතිය ඉදිරියට පැමිණවීමට පියවර ගතයුතු යැයි කොමිසම නිර්දේශ කරයි.*

*ඈ. ජනමාධ්‍යවේදීනට උතුරු නැගෙනහිර යාමේ ඊමේ නිදහස තහවුරු කළ යුතු ය. එමගින් ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට දායක වන පරිදි තොරතුරු හුවමාරුවට ඉඩ ලැබෙනු ඇත.*

*ඉ. තොරතුරු ලබා ගැනීමේ නිදහස තහවුරු කැරෙන නීති සම්පාදනය කළ යුතු ය. ''*

මෙකී ඉතා පැහැදිලි නිර්දේශ තිබියදීත්, උගත් පාඩම් කොමිසමේ නිර්දේශයන්ට අදාල ජාතික ක්‍රියාකාරී සැළැස්මෙහි (NAP) තොරතුරු නිදහසේ පනතක් සඳහා දින වකවානු සඳහන් නොකිරීම සහ මාධ්‍යයට එරෙහි ප්‍රහාරයන් සම්බන්ධයෙන් පවත්නා දුර්විපාක නොලැබීමේ සංස්කෘතිය අහෝසි කිරීමේ අවශ්‍යතාවය නොසළකා හැර තිබීම සම්බන්ධයෙන් අයි.එෆ්.ජේ. සහ එහි පාර්ශවකරුවෝ කණස්සල්ලට පත්වෙති.

මෙම ක්‍රියාකාරී සැළැස්ම සහ 2011 දෙසැම්බර් මාසයේ දී ප්‍රසිද්ධියට පත් කරන ලද *මානව හිමිකම් සුරැකීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ ජාතික ක්‍රියාකාරී සැළැස්ම* (NHRAP) අතර ඇති සම්බන්ධය යම්කිසි අපැහැදිලිතාවයකට මඟ පාදා තිබේ. දෙවැනි ක්‍රියාකාරී සැළැස්ම ගොඩ නැගුනේ 2008 මැයි මාසයේ පැවැති මානව හිමිකම් කවුන්සිලයේ ශ්‍රී ලංකාව සම්බන්ධ විශ්ව වාරික සමාලෝචනයේ දී ශ්‍රී ලංකාණ්ඩුව විසින් දෙන ලද ස්වෙච්ඡා පොරොන්දුවක් අනුව ය.

ජාතික ක්‍රියාකාරී සැළැස්ම මාධ්‍ය නිදහසට ඍජු ම සම්බන්ධ ය. ඊට අනුව තොරතුරු නිදහසේ පනතක් වසරක් තුළ නීතිගත කරනු ඇත. නිල රහස් පනත සය මසක් තුළ විමර්ශනය කරනු ඇත. අන්තර් ජාලයට පිවිසීම පිළිබඳ සම්පූර්ණ නිති රීති මසක් තුළ ඇතිකරනු ඇත. මෙම කිසිදු පොරොන්දුවක් තවම ඉටු කර නැත. සිදුව ඇත්තේ මෙම වාර්තාවෙහි පසුව සඳහන් කරන පරිදි වෙබ් අඩවි ලියා පදිංචි කිරීමේ හිතුවක්කාර නීතියක් මගින් පැහැදිළි නීතිමය හෝ ව්‍යවස්ථාමය වරමකින් තොරව මාධ්‍ය නිදහස සීමා කිරීමේ ප්‍රායෝගික ක්‍රමයක් ඇති කිරිම ය.

එමෙන්ම තොරතුරු නිදහස සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුවේ අවසන් ප්‍රකාශය ද උක්ත පොරොන්දුවට පටහැණිය. 2011 ජූනි මාසයේ දී විපක්ෂයේ නියෝජ්‍ය නායක විසින් පුද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස ඉදිරිපත් කළ

තොරතුරු නිදහසේ පනත පරාජය කිරීමට පාලක සන්ධානය පාර්ලිමේන්තුවේ සිය බහුතර බලය යෙදවූයේ ය. ඉන් පසු මානව හිමිකම් ජාතික ක්‍රියාකාරී සැළැස්ම සහ එල්.එල්.ආර්.සී. ක්‍රියාකාරී සැළැස්ම ප්‍රසිද්ධියට පත් කරන ලද අතර ස්වකීය භාවිතය වෙනස් කිරීමට අදහසක් ඇතැයි කිසිදු පැහැදිළි ප්‍රකාශයක් ආණ්ඩුවෙන් කෙරී නැත.

## නිදහස් සංචරණය තවම බොහෝ දුරය

2012 සැප්තැම්බර් මාසයේ අග භාගයේ දී අභ්‍යන්තරව විතැන්වූ සරණාගතයින් සඳහා පවත්වා ගෙන ගිය මැණික් ෆාම් නම් කඳවුර වසා දමන ලදී, එය පිහිටා තිබුණේ රටෙහි උතුරුකරයේ වව්නියා නගරයේ ය. වව්නියාව යුද්ධයේ අවසාන භාගයේ දරුණුතම හානි ලද වන්නි කලාපයේ එක් දිස්ත්‍රික්කයකි. යුද්ධාවසානයෙන් පසු එළඹි මාසයන්හි මෙම කඳවුරෙහි 300,000 පමණ ජනයා රඳවා සිටියහ. මූලික පහසුකම් පවා නැතිව, අව්වැසි යනාදියට මුහුණ දෙමින් ඔවුන් සිටියේ කටුකම්බි වැටෙන් එපිට අනාගතයක් ගැන අවිනිශ්චිත බවිනි. 2010 මුල් භාගයේ සිට, ඒ වන විට රුඳවුම් කඳවුරු ලෙස ලොව පුරා අපකීර්තියක් අත්කර ගනිමින් තිබූ මැණික් ෆාම් කඳවුරෙහි රැඳවියන්ට ආපසු නිවෙස් බලා යාමට අවසර දීමට ශ්‍රී ලංකාණ්ඩුව ආරම්භ කළේ ය. දීර්ඝ වසර ගණනාවක් පුරා වාර්ගික වෛරයන්ගෙන් සහ ඝාතනයන්ගෙන් විනාශයට පත් රට සීඝ්‍රයෙන් සාමන්‍ය තත්ත්වයට ගෙන ඒම ආරම්භයක් ලෙස රජය මෙම පියවර වර්ණනා කළේ ය. එනමුත් මෙම ප්‍රශ්ණයට සංවේදී වූ ශ්‍රී ලාංකික ජනමාධ්‍යකරුවෝ එම පිරිස්හි ආපසු යෑම ගවේෂනය කරමින් මෙම සරණාගතයනට ආපසු යෑමට තැනක් ඉතිරි වී නැති බව පෙන්වා දුන්හ. යුද්ධයේ අවසාන අදියරයන්හි දී සිදුව තිබූ විනාශයන්ගෙන් පසු ජීවිතය ගොඩ නැගීමට අවශ්‍ය සම්පත් ඔවුන් සතුව තිබුනේ නැත. එමෙන්ම ජාතික ආරක්ෂක පිළිවෙතක් ලෙස උතුරෙහි සහ නැගෙනහිරෙහි දියත් කර තිබූ උග්‍ර මිලිටරිකරණය හමුවෙහි තමන් ජීවත්ව සිටි ඉඩ කඩම් කොහිදැයි පැහැදිලි අදහසක් ඇති කර ගැනීමට ඔව්හු අසමත්ව සිටියහ.

2012 සැප්තැම්බරය වන විට මැණික් ෆාම් කඳවුරෙහි සිටියේ 1,200ට නොඅඩු සරණාගත පිරිසකි. කඳවුර වසා දැමීම වැදගත් පියවරක් යැයි රජය වර්ණනා කළේ ය. එසේ නමුත් පැතිර පවත්නා අවිශ්වාසයේ පසුබිම මැද එය සැළකුණේ හුදෙක් ඔක්තෝබරය අවසානයේ දී ආරම්භ වූ එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකාව සම්බන්ධ සර්ව වාරික සමාලෝචනයට සූදානමක් වශයෙන් මතුපිට වර්ණ ගැන්වීමක් ලෙස ය. පශ්චාත් යුද්ධ මාසයන්හි දී උපරිම වශයෙන් ව්‍යාප්ත වූ මෙම සරණාගත කඳවුර සීඝ්‍රයෙන් අවම තත්ත්වයකට ගෙන ඒමෙන් ලද ප්‍රචාරක වාසිය හැරුණ විට යළි පදංචි කරවන ලද ජනයාගේ ජීවිත ගුණාත්මක කරනු පිණිස ශ්‍රී ලංකාණ්ඩුවෙන් ලබා දෙන සහතික තවමත් ඇත්තේ ප්‍රශ්නයක් ලෙස ය.

මැණික් ෆාම් කඳවුර වසා දමන බවට ශ්‍රී ලංකාණ්ඩුව නිවේදනය කළ වහාම *සිලෝන් ටුඩේ* පුවත්පතෙහි වාර්තාකාර කණ්ඩායමක් පශ්චාත් යුද්ධ යළි පදිංචි කිරීමේ අවසාන දවස් වාර්තා ගත කිරීම පිණිස වන්නියට ගියහ. උග්‍ර මිලිටරි බාධා මැද මැණික් ෆාම් කඳවුරු වැසියන් යළි පදිංචි කරන ලද ස්ථාන කරා යාමට සමත් වූ ඔවුනට එම ජනයාගේ අවිනිශ්චිතභාවය ගැන බොහෝ කරුණු දක්නට ලැබුණි. ඔවුන් ලියූ වාර්තාව මෙසේ ද සඳහන් කළේ යː '' ශ්‍රී ලංකාවේ

යුද්ධයෙන් විතැන් වූ ජනයා ගැන තොරතුරු හෙළිදරව් කර ගැනීම බියජනක ක්‍රියාවක් බවට පත් විය හැකි ය,'' මැණික් ෆාම් කඳවුර වසා දැමීම පිළිබඳ වාර්තා කිරීමේ කාර්ය යෙහි ලා මුහුණ දුන් බාධක ඔවුන් විසින් ම වාර්තා කළේ මෙසේ යඃ

*'' මුලතිව් දිස්ත්‍රික්කයෙහි සීනියාමෝත්තෙයි යැයි කියන අප්‍රසිද්ධ බිම් කඩෙහි සිදුවන්නේ කුමක් ද යන්න තදින් ආරක්ෂා කැරෙන රහසකි. විවිධ රජයේ ආයතන ඒ ගැන විවිධ අර්ථ කථන දෙයි. බොහෝ විට අසන්නට ලැබෙන්නේ ඉතා බලවත් ආයතනයක් වන ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලිඛිත අවසරයක් නැතොත් කිසිදු තොරතුරු ලබා දීම බලධාරීන්ට තහනම් බවය.*

*අපට සුහද සැළකීමක් ලැබෙනු ඇතැ යි අප තුළ අපේක්ෂාවක් තිබුණේ නැත. එසේ නමුත් මෙම යළි පදංචි කිරීමේ නව මූලිකත්වය අවම වශයෙන් කලක් යනතුරු හෝ රහසිගත මෙහෙයුමක් ලෙස පවතින බව අපට ඒත්තු ගන්වන ලදී. සුභ සාධක කඳවුර ඇතුළත කිසිවකුට නැරඹීමට තරම් කිසිවක් නැතැයි ද අප ' ඕනෑවට වඩා කුතුහලයක් ඇති කර ගත යුතු නැතැයි' ද රළු පරළු ලෙසම අපට දන්වන ලදී. යුද හමුදාව විසින් පහසුකම් සළසනු ලබන එය, තවමත් නිමවා අවසන් නැති බවට බොහෝ සාක්ෂි පෙනෙනන්ට තිබුණි.*

*'' මෙහේ බලන්න දෙයක් නැහැ, වෙනහක යන්න. ගිහිල්ල ප්‍රභාකරන්ගේ නාන තටාකය බලන්න[1] '' යැයි කියා රාජකාරියේ යෙදී සිටි එක් කනිෂ්ඨ නිලධාරියකු අපට කීවේ ය. එම මෙහෙයුම කැරෙන ආකාරය යළි පදංචි කරවීමේ ක්‍රියාවළියෙහි පාරදෘශ්‍ය බව සහ වගවීම පිළිබඳ උඩගු කතාන්තරවලට සහමුලින් ම වෙනස් ය. එමතු ද නොව '' දැන් සරණාගතයින් නැහැ, ඕනම තැනක ගිහින් බලන්න පුලුවන්'' යැයි යනුවෙන් කොළඹදී අප ලද සහතික කිරීම්වලට ද වඩා වෙනස් එකකි.[2]*

සීනියාමෝත්තෙයි කරා ගිය ගමනත් එහි තොරතුරු තහංචියත් විසින් පෙන්වාලන්නේ මෙය පශ්චාත් යුද්ධ අවධිය වන නමුත් යුද්ධාවසානයට සම්බන්ධ බොහෝ කරුණු විමර්ශනය කිරීම තවමත් තහංචියක් බවයි. එබැවින් සීනියාමෝත්තෙයි කතාන්තරය සාකච්ඡාවට කාරණයක් නොවේ. නව '' සුභ සාධක'' ගම්මානයට ඇතුළුවීම අපට තහනම් කළ විට එය පුදුමයක් වුයේ නැත. යළි පදිංචි කරවන ලද පිරිස් විශ්වාසයට ගන්නේ නම් එහි ඇති සුභ සාධනයක් නැත. ජලය නැත. විදුලිය නැත. පිසූ ආහාර ද නැත. බදාදා ඇද වැටුණු වර්ශාව නිසා ප්‍රමාණවත් තරම් කුඩාරම් නොතිබූ එහි සරණාගත පිරිස් තෙතබරි වූහ. ''

---

[1] 2009 මැයි මාසයේ දී ශ්‍රී ලංකා හමුදාවට පරාජය වූ දෙමළ කැරළිකාර කණ්ඩායමේ නායක ප්‍රභාකරන්ට කරනු ලබන සඳහනකි

[2] [2] "Relocated to Nowhere", *Ceylon Today*, September 29 2012; extracted on October 25, 2012 at: http://www.ceylontoday.lk/59-13681-news-detail-relocated-to-nowhere.html.

යළි පදිංචි කිරීම් පිළිබඳ ආණ්ඩුවේ කතාන්තරය පිරික්සා බැලීම පිණිස වන්නිය බලා ගිය *ලංකා ස්ටෑන්ඩඩ්* වෙබ් අඩවියේ වාර්තාකාරියක විසින් ද මෙවැනි ම වාර්තාවක් පළ කරන ලදී:

> *'' මුලතිව්හි ආරක්ෂක සේනා මූලස්ථානය ආසන්නයේ පිහිටි සූරියපුරම් කඳවුර හමුදා බණ්ඩයක් විසින් රැකවල්ලා ඇති අතර ඇත්ත තත්ත්වය හෙළිවේයැයි බියෙන් මාධ්‍යයට සරණාගතයින් හමුවීමට තහනම් කර තිබේ..... 2012 සැප්තැම්බර් 26 වන බදාදා සරණාගතයින් 'යළි පදිංචි කිරීමේ' වැඩ සටහනෙහි සාර්ථකත්වය වාර්තා කරනු පිණිස නන්දිකඩාල්හි සූරියපුරම් කඳවුරට ගිය ලංකා ස්ටෑන්ඩර්ඩ් කණ්ඩායම හමුදාව විසින් අතරමග නතර කරන ලදී. මුලතිව් දිසා ලේකම් කාර්යාලයෙන් හෝ මුලතිව් ආරක්ෂක හමුදා මූලස්ථානයේ සිවිල් කටයුතු කාර්යාලයෙන් හෝ අවසරයක් නැත්නම් අපට ඉදිරියට යාමට ඉඩ දිය නොහැකි යයි අප නතර කළ හමුදා පිරිස පැවසූහ... බදාදා සහ බ්‍රහස්පතින්දා මුලතිව්හි සිටි මට සහ මගේ ඡායාරූප ශිල්පියාට නන්දිකඩාල්හි සූරියපුරම් කඳවුරට ඇතුළු වීමට හමුදා නිලධාරීන් අවසර දුන්නේ නැත. මේ වනාහි ඔවුන්ගේ ගම්බිම්හි යළි පදිංචි කරවන බව ආණ්ඩුව ප්‍රකාශ කළ ද මැණික් ෆාම් කඳවුරේ සිටි අවසන් සරණාගත පිරිස ගෙන එන ලද කඳවුර ය. ඔවුන් අප නතර කළා පමණක් නොව ඔවුන්ට විරුද්ධව කිසිවක් නොලියන ලෙස තර්ජනය ද කළහ. ..තාවකාලික කඳවුර තුළ සිටි එක් හමුදා නිලධාරියෙක් වහාම පිටව යන ලෙස මට කෑ ගැසූ අතර කඳවුරට විරුද්ධව හෝ සරණාගත දුක්ගැනවිලි පිළිබඳව කිසිවක් නොලියන ලෙසත් ' 'මගේ වැඩක් බලා ගන්නා ලෙසත්' තර්ජනය කළේ ය.''[3]*

පශ්චාත් යුද්ධ පුනරුත්ථාපනය ගැන වාර්තා කිරිමේ යහපත් අදහසින් යුතුව ඉදිරිපත් වුවද ආරක්ෂක හමුදාවන්ගෙන් සහ අනෙක් ආයතන කෙරෙන් සෘජු බාධා කිරීම් එළඹෙන බව විශ්වාස කිරීමට ඇති තරම් කරුණු තිබේ.[4] මේ වනාහී එල්.එල්.ආර්.සී. නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජපක්ෂ පාලනය අසමත්වනු ඇති වැදගත් ක්ෂේත්‍රයකි. ජනමාධ්‍යවේදීන්ට එල්ල කරනු ලැබ ඇති ප්‍රහාර සම්බන්ධයෙන් එල්.එල්.ආර්.සී. ය සිය කරුණු විමසීම් පැවැත්වෙන අතරතුරදී ම, දෙමළ දිනපතා පුවත්පතක් වන උදයන්හි ප්‍රවෘත්ති කර්තෘ කුහනාදන්ට එල්ල කරන ලද මරණීය ප්‍රහාරය සම්බන්ධයෙන් සිය උගහට ප්‍රකාශ කළෝ ය. 2011 ජූලි 29 දින සැන්දෑවෙහි සිය නිවස බලා යමින් සිටිය දී නාඳුනන දෙදෙනෙකු විසින් යකඩ පොලුවලින් පහර දෙනු ලදුව පනස් නව හැවිරිදි කුහනාදන් මියයනු පිණිස දමා ගොස් තිබුණි. මරණාසන්නව වැතිරී සිටි ඔහු බේරා ගැනුනේ මගියකු ඔහු දැකීමෙන් පසුව යාපනයේ මහ රෝහලට ඇතුල් කොට ජීවිතාරක්ෂක යන්ත්‍රයකට සවි කිරීමෙන් පසුව ය.

---

[3] "The Menik Farm Lie: 'Who Says We Are Resettled?' asks an IDP", Lanka Standard, published 30 September 2012; available at: http://www.lankastandard.com/2012/09/the-menik-farm-lie-who-says-we-are-resettled-asks-an-idp/.

[4] මුලික කරුණු අතින් සමාන වුවද උතුරු පළාතෙහි යළි පදංචිකරවීම් පිළිබඳ වඩා විස්තර සහිත වාර්තාවක් වෙනත් මාධ්‍ය වාර්තාවක් මෙහි ඇත
: http://www.srilankabrief.org/2012/10/restrictions-and-intimidation-on.html.

## අවසානයක් නැති විනිර්මුක්තිය (දුර්විපාක නොලැබීම)

මෑත දී පවත්වන ලද නැගෙනහිර පළාතේ පළාත් පාලන මැතිවරණයේ දී රාජපක්ෂගේ පාලක සන්ධානයට මහත් විරුද්ධත්වයක් දක්වන දෙමළ ජාතික සන්ධානය ( ටී.එන්.ඒ.) මැතිවරණ පැවැති ආයතන 23න් 18ක බලය දිනා ගත්තේ ය. දෙමළ ජාතික සන්ධානයට සහාය දක්වන *උදයන්* පුවත්තෙහි කර්තෘ පිළිවෙත එහි ප්‍රවෘත්ති කතුවරයාට එල්ල වූ මරණාසන්න ප්‍රහාරයට හේතුව යැයි පෙනෙන්නට තිබේ. මේ වනාහි මාස කිහිපයක් ඇතුළත උදයන් කර්තෘ මාණ්ඩලිකයකුට එල්ල වූ දෙවන ප්‍රහාරය යි. මැයි 28දා වැඩ අවසන්ව නිවෙස බලා යමින් සිටි එහි වාර්තාකරුවකු වූ එස්. කවිදරන්ට නගරයේ දී එවැනිම ප්‍රහාරයක් එල්ල විය. ඒ සම්බන්ධයෙන් ද පවත්වන ලද පරීක්ෂණයක් නැත.

දැන් කුහනාදන් සහ කවිදරන් යන දෙදෙනාම ස්විස්ටර්ලන්තයේ දේශපාලන රැකවරණ ලබා සිටිති.

මේ වනාහී යාපනයේ දී මෙන්ම පිටතදී *උදයන්* කාර්ය මණ්ඩලයට සහ කාර්යාලයට එල්ල වූ ප්‍රහාරයන්ගෙන් මෑත ම සිදුවීම් ය. 2006 ජනවාරි මාසයේ දී *උදයන්* කණ්ඩායමේ පුවත්පතක් වූ සුදරෝලි හි වාර්තාකරුවකු වූ එස්. එස්. සුකීර්දරාජන් නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලයේ දී වෙඩි තබා ඝාතනය කරන ලදී. එයට හේතු වූයේ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා විසින් දෙමළ ශිෂ්‍යයන් පස් දෙනෙකු වෙඩි තබා ඝාතනය කිරීම ඔහු විසින් හෙළිදරව් කිරීම බව පෙනෙන්නට තිබුණි. එම වසරෙහිම මැයි මාසයේ දී උදයන් කාර්යාලයට එල්ල කරන ලද, එහි ඉලක්කය කුහනාදන් විය හැකිව තිබු, සන්නද්ධ ප්‍රහාරයකින් එහි සේවකයින් දෙදෙනෙකු මිය ගියේ ය. එම මාසය අග දී *උදයන්* සමූහයට අයත් බෙදා හැරීමේ වෑන් රථයකට ප්‍රහාරයක් එල්ල වූ අතර එහි රියැදුරු මිය ගියේ ය. 2006 අගෝස්තු මාසයේ දී *උදයන්* කාර්යාලයට තවත් ප්‍රහාරයක් එල්ල විය. තවද 2007 අප්‍රේල් මාසයේ දී එහි යාපනය නගර වාර්තාකරු වූ එස්. රජිව්වර්මන් උතුරු පළාතෙහි සිදුවන අතුරුදහන්වීම් වාර්තා කිරීමෙන් පසු වෙඩි තබා ඝාතනය කරන ලදී.

එවකට ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු තානාපතිවරයා විසින් ජනාධිපතිවරයාගේ සහෝදරයකු වූත් ඔහුගේ ''ජ්‍යෙෂ්ඨ උපදේශක'' ලෙස නම්කර තිබුණා වූත් බැසිල් රාජපක්ෂ සමඟ කරන ලද සාකච්ජාවක් ඇසුරින් යවන ලද රාජ්‍ය තාන්ත්‍රික කේබල් පණිවිඩයක් 2012 ජනවාරියේ දී ප්‍රසිද්ධියට පැමිණුනි.[5] බැසිල් රාජපක්ෂ '' විමතිය ඇති කරන අවංකබවකින්'' කතා කළ බව සඳහන් කරන එම කේබල් පණිවිඩය ත්‍රිකුණාමලයේ සිසුන් පස්දෙනා ඝාතනය කරන ලද්දේ ශ්‍රී ලංකා පොලීසියේ සහ හමුදාවේ අයවලුන් ද සමඟ විශේෂ කාර්ය බලකාය විසින් විය හැකි බව ඔහු කීවේ යැයි ද සඳහන් කරයි. රහසිගතබාවයේ විශ්වාසය මත පදනම්ව කරන ලද නමුත් බැසිල් රාජපක්ෂ, විසින් එම අපරාධයට වගකිව යුතු ආරක්ෂක අංශ නම් කිරීම මෑත කාලීන රාජ්‍ය තාන්ත්‍රික ඉතිහාසයෙහි දුර්ලභ අවස්ථාවක් විය යුතු ය. එම සාකච්ජාවේදී ම බැසිල් රාජපක්ෂ විසින් ඇමෙරිකානු තානාපතිවරයාට කී බවට වාර්තා වී ඇති අනෙක්

5

එකල්හි ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු තානාපතිවරයා වූත් පසුව බරක් ඔබාමා පාලනය යටතේ දකුණු ආසියාව බාර නියෝජ්‍ය රාජ්‍ය ලේකම්වරයාවූත් රොබට් බ්ලේක් විසින 'යවන ලද සම්පූර්ණ කේබල් පණිවිඩය සඳහා බලන්නඃ : http://www.wikileaks-forum.com/index.php?topic=8231.0.

කරුණක් නම් ජනාධිපතිවරයාගේ සමීපතම දේශපාලන මිතුරන් දෙදෙනෙකු වන ඩග්ලස් දේවානන්ද සහ විනායගමූර්ති මුරලිදරන් ( නොහොත් කර්නල් කරුනා) ඔවුන්ගේ සන්නද්ධ කේඩර්වරුන් දේශපාලන අධිකාරයන් මත මුදා හරිමින් උතුරු නැගෙනහිර දී ප්‍රශ්න ඇති කරමින් සිටින බවයි. අගෝස්තු මාසයේ දී *උදයන්* පුවත් පතට එල්ල කළ ප්‍රහාරය ශ්‍රී ලංකා නාවික හමුදා පිරිස්හි ආධාරය ඇතිව ඩග්ලස් දේවානන්දගේ දේශපාලන පක්ෂය විසින් කරන්නට ඇතැයි ද බැසිල් රාජපක්ෂ විසින් කියා තිබුණි.

ත්‍රිකුණාමල සිදුවීම අවස්ථාවෙහි සුදරෝලි පුවත්පතෙහි කර්තෘ වූ එන්. විද්‍යාදරන් සිසුන් දෙදෙනාගේ මරණය සිදුවූයේ ඒ සම්බන්ධයෙන් රජයේ කතාන්තරය වු එකලස් කරමින් සිටි බෝම්බයක් පිපිරීම නිසා නොහැකි බවට සුකීර්දරාජන් තමාට වහාම දනුම් දුන් බව සිහි ගන්වයි. ඔහු මෙම නිගමනයට පැමිණ සිටියේ මෘතදේහාගාරයේ කාර්ය මණ්ඩලය සමඟ කතා කිරීමෙන් පසුව ය. කතුවරයාගෙන් ලද නිශ්චිත උපදෙස් මත මෘතදේහාගාරයේ අවම මුරකාවල් ඇති අවස්ථාවක සුකිර්දරාජන් ඊට ඇතුල් වී ලබා ගත් ජායාරූප සුදරෝලි පුවත්පත ඊළඟ දිනයේ දී පළ කරන ලදී, එමගින් රජයේ කතාන්තරය සහමුලින්ම අනාථ විය. දෙදිනකට පසු රාජකාරිය පිණිස යෑම පිණිස සූදානම් වෙමින් සිටි සුගීර්දරාජන් නිවසින් පිටතට කැඳවූ යතුරු පැදිකරුවන් කණ්ඩායමක් ළඟ ළඟ වෙඩි තබා ඔහු ඝාතනය කරන ලදී.

දේවානන්ද සහ කරුණා ජනාධිපති රාජපක්ෂට තවමත් නැතිව ම බැරි සගයින් ය. උතුරෙහි සහ නැගෙනහිරෙහි පාලක සන්ධානයේ වාසනාව රඳා පවත්වා ගැනීමට එම දෙදෙනා ම අත්‍යවශ්‍ය ය. මෙම තත්ත්වය යටතේ මෙම අපරාධයන් සම්බන්ධයෙන් කවර හෝ වගවීමක් ඇති වනු ඇතැයි සිතීම දුෂ්කර බව ශ්‍රී ලංකවේ මාධ්‍ය නිදහසේ ආයතන කල්පනා කරති. එක්සත් ජනපද තානාපතිවරයාගේ කේබල් පණිවිඩය හෙළිදරව් වීමෙන් පසු මාධ්‍ය ගණනාවක් එහි අන්තර්ගතය යළි පළ කළහ. මෙම සියළු මාධ්‍ය අතුරින් දේවානන්ද අපහාස නඩුවක් පැවැරීමට තෝරාගෙන ඇත්තේ *උදයන්* පුවත්පත පමණි.

2009 ජනවාරියේදී සන්ඩේ ලීඩර් කර්තෘ ලසන්ත වික්‍රමතුංගගේ ඝාතනය කිරීම හෝ 2010 ජනවාරියේ දී කාටූන් ශිල්පී ප්‍රගීත් එක්නැළිගොඩ අතුරුදහන් කරවීම හෝ සම්බන්ධයෙන් පරීක්ෂණයන්හි ප්‍රගතියත් නැති තරම් ය. තීරණාත්මක හෙළිදරව්වක් අත ළඟ යැයි කලින් කලට පරීක්ෂණ බාර ආයතන විසින් කරනු ලබන නිවේදන නොසළකා මෙම සිදුවීම් දෙක ම සම්බන්ධයෙන් වන නඩු විභාග නැවත නැවත කල් දමා තිබේ. පොලීසිය තවමත් කිසිදු වැදගත් හෝඩුවාවක් වාර්තා කර නැත.

මේ අතර අයි.එෆ්.ජේ. සමාජික නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය ද ඇතුළුව ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීයමය ආයතන විසින් දුර්විපාක නොලැබීමේ මෙම සංස්කෘතිය පිළිබඳ ප්‍රශ්ණය මතු කිරීම රජයේ පිරිස් විසින් රාජ ද්‍රෝහී ක්‍රියාවක් ලෙස හංවඩු ගසනු ලැබ ඇත. මෙම වසරේ ජනවාරි මාසයේ දෙවන සතියේ දී රජයේ රූපවාහිනී නාලිකාවක් නි.මා.ව්‍යා.ට එරෙහිව අතිශය දරුනු ප්‍රහාරයක් දියත් කළේ ය. නි.මා.ව්‍යා. සාමජිකයින් සහ ක්‍රියාකාරීන් යෙදුණු උද්ඝෝෂණයන්හි වීඩියෝ දර්ශන පෙන්වමින් එම නාලිකාව දුෂ්ඨ වචන යොදා ගනිමින් ප්‍රහාරාත්මක විස්තරයක් කළේ ය. ශ්‍රී ලංකාවේ අයි.එෆ්.ජේ. මූලාශ්‍ර විසින් සපයන ලද විශ්වසනීය

පරිවර්ථනයකට අනුව මෙම විස්තර කථනය නි.මා.ව්‍යා. ක්‍රියාකාරීන් රන් කහවනු සහ තනතුරු සඳහා මාතෘ භූමිය පාවා දෙන ද්‍රෝහීන්'' ලෙස සඳහන් කර තිබුණි. රජවරුන්ගේ සමයන්හිදී මරා ඝාතනය කරන ලද පුද්ගලයින්ගෙන් පැවැතෙන්නන් ''තවමත් ජීවතුන් අතර'' ඉන්නේ යැයි අපහාසයෙන් සඳහන් කළ එය '' රටට හොඳක් නොකරන එවුන්ට දිනෙක නොහොඳක්ම සිදුවනු ඇතැයි'' ශපථ කළේ ය.

## වාග් ප්‍රහාර පිළිවෙතක් බවට

ජනවාරි 10දා රජයේ මාධ්‍ය ශ්‍රී ලංකාවට යුරෝපා සංගමයෙන් ලැබෙමින් තිබූ ජී.එස්.පී ප්ලස් ආර්ථික සහනයන් වැළැක්වීමට පෙත්සම් යැවූයේ යැයි නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට චෝදනා කළේය. එහි හිටපු කැඳවුම්කරුවන් දෙදෙනෙකු සහ නොනමින් නමුත් ඇඟවෙන පරිදි ඒ වන විට සිටි කැඳවුම්කරු ද, ශ්‍රී ලංකාවේ බොහෝ කර්මාන්ත වාසි ලබමින් සිටි එම සහනය අහෝසි කිරීමට කටයුතු කළැයි එම චෝදනාවෙන් කියැවිනි. වාර්තාවෙහි දරුණු එදිරිවාදී වගාලාප නොතිබුණ ද නම් කරන ලද පුද්ගලයින් '' ජාති ද්‍රෝහී අයවලුන්'' ලෙසත් '' විදේශ අරමුදලින් ජීවත්වන'' අය ලෙසත් හඳුන්වා තිබුණි. මෙම චෝදනා බොහෝ කොට ම වැරදිය. මන්ද යත් නි.මා.ව්‍යා. කිසි විටෙක ශ්‍රී ලංකාවට ලැබුණ වෙළඳ සහනය අහෝසි කරන ලෙස ඉල්ලා නොසිටි නිසා ය.

මෙම විශේෂ වාග් ප්‍රහාරය එල්ල වන්නට ඇත්තේ නි.මා.ව්‍යා. ය පසුගිය ජනවාරි මාසයන්හි දී ජනමාධ්‍යවේදීන්ට පමුණුවන ලද අපරාධකාරී ප්‍රහාරයන් අනුස්මරණය කරමින් ජනවාරි 25 දින 'කලු ජනවාරිය' නමින් උද්ඝෝෂනයක් සංවිධානය කරමින් සිටීම නිසා විය හැකි ය. ලසන්ත වික්‍රමතුංග ඝාතනය මෙන්ම ප්‍රගීත් එක්නැළිගොඩ අතුරුදහන්වීම ද ජනවාරි මාසයන්හි සිදුවූ එවැනි අපරාධ අතර වෙති. නි.මා.ව්‍යා.ය විසින් සංවිධානය කළ උද්ඝෝෂණය පැවැත්වීමට දිනකට පෙර එය කොළඹ කොටුව දුම්රිය පොළ ඉදිරිපිට ඉතා කුඩා බිම්කඩකට සීමා කළයුතු බවට අධිකරණ නියෝගයක් ආණ්ඩුව ලබා ගත්තේ ය. උද්ඝෝෂණය දිනයෙහි එය පැවැත්වීමට නියමිතව තිබූ ස්ථානය පොලු රැගත් දාමරික පිරිස් විසින් කල්තබාම අල්ලා ගෙන තිබුණි. මෙම පිරිස් අතදරා සිටි සටන් පාඨ විසින් නි.මා.ව්‍යා.ය එල්ටීටීඊයේ සහායකයකු ලෙස කෙළින්ම හඳුන්වා තිබුණි. 2009 මැයි මාසයේ දී දෙපාර්ශවය විසින්ම කරන ලද උග්‍ර මානව හිමිකම් කෙළෙසීම් වාර්තා වූ සිවිල් යුද්ධයකින් පසු ආණ්ඩුවේ හමුදා විසින් වාර්ගික කැරලිකාර කණ්ඩායමක් වූ එල්ටීටීඊ ය පරාජය කරන ලදී.

ජනවාර් 25 දින රජයේ *ඩේලි නිව්ස්* පුවත්පත කතුවැකියක් පළ කරමින් '' කඩාකප්පල්කාරි පිරිස් විසින් රටෙහි ඉදිරිගමන වැළැක්වීමට දරනු ලබන ප්‍රයත්නයන් මර්දනය කරනු ඇතැයි'' අනතුරු හැඟවූයේ ය. එම කතුවැකිය නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ''ශ්‍රී ලංකා ආණ්ඩුව හෙළා දකින එවැනි සංවිධාන අතර ඉදිරියෙන්ම සිටින'' එකක් ලෙස හඳුන්වා තිබුණි. නි.මා.ව්‍යා. අර්බුද මැද හිරවී සිටින බවටත් එය තමන් ගැනම බොහෝ විමසා ගැනීම් '' කළ යුතු බවටත් කතුවැකිය අනතුරු හැඟවූයේ ය.

ජනවාරි 26 දා රජයේ ලේක්හවුස් (ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම) ආයතනයේ සිංහල පුවත්පත වන *දිනමිණ* අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ලගේ

ප්‍රකාශයක් පළ කරමින් කියා සිටියේ මානව හිමිකම් සහ ප්‍රතිසන්ධානය වෙනුවෙන් ව්‍යාපාරයන්හි යෙදෙන විදෙස්ගත ජනමාධ්‍යවේදීන් රට ''අපකීර්තියට'' පත් කරන ''ද්‍රෝහීන්'' බවය. පසුව එම ආයතනයේ ම *ඩේලි නිව්ස්* පුවත්පත ජනමාධ්‍ය නිදහස වෙනුවෙන් කටයුතු කරන්නන් ඇතුළුව මානව හිමිකම් ආරක්ෂකයින් ගණනාවක් නමින් සඳහන් කොට ඔවුන් පරාජය කරන ලද දෙමළ කැරලිකාර කණ්ඩායමේ ඉතිරිවී සිටින ත්‍රස්තවාදී පිරිස් සමඟ කටයුතු කරන්නේ යැයි වාර්තාවක් පළ කළේ ය.

ජනමාධ්‍ය නිදහස වෙනුවෙන් ක්‍රියාකරන්නකු වන සුනන්ද දේශප්‍රිය ශ්‍රී ලංකාව පාවා දීමේ ක්‍රියාවලියේ දිගටම නියැලෙමින් පරාජිත දෙමළ කැරලිකාර කණ්ඩායම වන එල්ටීටීඊයේ ඉතිරි වී සිටින කොටස් සමඟ කටයුතු කරන්නේ යැයි පසුව ලේක් හවුස් ආයතනයේ ඉංග්‍රීසි භාෂා දිනපතා පුවත්පත වන *ඩේලි නිව්ස්* වාර්තා කළේය.

මාර්තු 16දා මානම හිමිකම් ආරක්ෂකයින් පිරිහුණු පුද්ගලයින් ලෙස දැක් වූ දිනමිණ ''එල්ටීටීඊයේ ප්‍රචාරකයකු'' යැයි දේශප්‍රිය හෙළා දැක්කේ ය. ඉරානය වැන රටකදී නම් මෙවැනි භ්‍රෂ්ඨයින් ගල් ගසා මරා දමනු ඇතැයි එය අනතුරු හැඟවූයේය.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 2012 මාර්තු සැසිවාරය ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වාර්තාව විමසා බලන යෝජනාවක් සැළකිල්ලට ගැනීමත් සමඟ මෙම ගර්හා කිරීම් ඉහළ නැගුණි. මාර්තු 16වන දින ලියූ කතුවැකියක් මගින් එය මානව හිමිකම් ආරක්ෂකයින් '' පිරිහුණු පුද්ගලයින් ලෙස'' හැඳින් වූ අතර නමින් සඳහන් කළ මාධ්‍ය නිදහස් උද්ඝෝෂකයින් ''එල්ටීටීඊ ප්‍රචාරකයින් ලෙස'' ගර්හාවට ලක් කළේ ය. තවද ''ඉරානය වැනි රටක දී නම් මෙවැනි පුද්ගලයින් ගල් ගසා මරා දමනු ඇතැයි'' එය අනතුරු ඇඟ වූයේ ය.

මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනයේ (ලේක්හවුසියේ සහ අනෙක් රාජ්‍ය ජනමාධ්‍ය ආයතනයන්හි සේවකයින් මූලික වශයෙන් එයට ඇතුළත් වේ) ජ්‍යෙෂ්ඨ නායකයකු වන ධර්මසිරි ලංකාපේලි එලෙස ගර්හාවට ලක් වූ ප්‍රධාන ඉලක්කයක් විය. මෙම ප්‍රහාරයන් සමාජ විද්‍යාඥයින් සහ දේශපාලන විචාරකයින් වන පී. සරවනමුත්තු, නිමල්කා ප්‍රනාන්දු, සහ සුනිලා අබේසේකර වැනි අය කරාද යුද්ධාවසානයේ සිට ප්‍රතිසන්ධානය සහ මානව හිමිකම් කෙළෙසීම් සම්බන්ධයෙන් වගවීම ඉල්ලා සිටි ක්‍රිස්තියානි සභාවේ ප්‍රධාන පිරිස් කරාද යොමු විය.

රජයට අයත් අයි.ටී.එන්.රූපවාහිනී නාලිකාව ජනමාධ්‍යවේදීන්ට සහ මානව හිමිකම් ආරක්ෂකයින්ට වාග් ප්‍රහාර සඳහා යොදා ගැනෙන තවත් තෝතැන්නකි. මානව හිමිකම් කවුන්සිලයේ 19වන සැසි වාරයට සහභාගි වූ ජනමාධ්‍යවේදීන්ට ''රට පාවා'' දුන් බවට චෝදනා කරමින් ජනවාරි 9 සහ 24 දින ඇතුළත පමණක් එය 'විමසුම' නම් වැඩ සටහන් පහක් විකාශනය කළා ය. ඊට අමතරව විවිධ දේශපාලන පිරිස් විසින් ජනමාධ්‍යවේදීන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් විදෙස් බලවේග විසින් නැටවෙන ත්‍රස්තවාදීන් සහ ද්‍රෝහීන් ලෙස පින්තාරු කරමින් සකස් කරන ලද ඡායාරූප ප්‍රචාරය කෙරුණි.

මාර්තු 23දා මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාවට විරුද්ධව කතා කරමින් අමාත්‍ය මර්වින් සිල්වා විදෙස්ගත ජනමාධ්‍යවේදීන් යළි සිය රට බලා පැමිණිය හොත් ඔවුන්ගේ '' අඬු කඩන'' බවට තර්ජනය කළේ ය. එලෙස සඳහන් කරන ලද එක් මාධ්‍යවේදියකු වූයේ 2009 ජූනි මාසයේ දී කොළඹ නගරයෙහිදී ම කුරිරු ප්‍රහාරයකට ලක්ව සදාකාලික අංග විකලත්වයකට පත් වූ ජනමාධ්‍යවේදී පෝද්දල ජයන්ත ය. ජනමාධ්‍යවේදීන් සමඟ නපුරු ගැටුම්වලට ප්‍රසිද්ධියක් උසුලන සිල්වා 2009 ජනවාරි මාසයේ දී ලසන්ත වික්‍රමතුංගගේ ඝාතනය කිරීම සහ ජයන්තට පහර දීම සම්බන්ධයෙන් ප්‍රශංසාව තමන්ට හිමියැයි 2009 ජූනි මාසයේ දී ප්‍රසිද්ධියේ කී බව වාර්තා විය. පසුව ඔහු තමා එසේ නොකී බව ප්‍රකාශ කළ නමුත් ජනමාධ්‍ය දඩයම්කරුවකු ලෙස දිගටම උග්‍ර අසහනයන් ඇති කරයි.

මාර්තු 22දින රජයේ අයි.ටී.එන්. නාලිකාව එවකට ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදින්ගේ සංගමයේ සභාපති වූ ඥානසිරි කොත්තිගොඩ පසුබිමෙහි පෙන්වමින් තමන් ඉක්මනින්ම ''ද්‍රෝහියකු'' හෙළි දරව් කරන බව වාර්තා කළේ ය. විස්තර කථකයා මර්දනකාරී තත්ත්වය හමුවෙහි රට හැර යාමට සිදුවූ ජනමාධ්‍යවේදීන් ගණනාවක් ''මාධ්‍ය ද්‍රෝහීන්'' ලෙස සඳහන් කොට කොත්තිගොඩ ඔහුගේ වාර්තාකරණයන් මගින් දෙමළ ඩයස්පෝරාවේ යම් පිරිස් විසින් ගෙනයමින් තිබෙන රට බෙදීමේ අරමුණට සහාය දෙන්නේ යැයි ඇඟවූයේ ය.

ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය SLWJA ( දැන් එය ශ්‍රී ලංකා ජනමාධ්‍යවේදීන්ගේ සංගමය ලෙස සිය නාමය වෙනස් කර තිබේ SLJA.) දීර්ඝ කාලයක් අයි.එෆ්.ජේ. හි සාමාජික සංවිධානයකි. කොත්තිගොඩට පෙර එහි සභාපතිවරයා වූ පෝද්දල ජයන්ත 2010 ජනවාරි මාසයේ සිට ඊට සය මසකට පෙර ඔහුට එල්ල වූ කුරිරු පහරදීම හේතු කොට ගෙන ජීවත්වන්නේ පිටුවහල්ව ය. මාර්තු 23දා කොත්තිගොඩ අයිටීඑන් නාලිකාව විසින් තමන්ට එල්ල කළ තර්ජන පිළිබඳව ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ඇමැතිවරයා වූ ලක්ෂ්මන් යාපා අබේවර්ධනගෙන් පුවත්පත් සාකච්ඡාවක දී විමසීය. ඇමැතිවරයා එම අවස්ථාවේදී ම අයි.ටී.එන්.හි ප්‍රවෘත්ති කතුවරයා වූ සුදර්මන් රුදලියගොඩ ඇමතූ බවත් කොත්තිගොඩට එරෙහි ප්‍රහාර නතර කරන බවට සහතිකයක් ලබා දුන් බවත් වාර්තා වේ. එනමුත් ශ්‍රී ලංකාවේ අයි.එෆ්.ජේ.හි විශ්වසනීය මූලාශ්‍රයන්ට අනුව එම ප්‍රහාර නැවැතී නැත.

රාජ්‍ය මාධ්‍ය මගින් කරන සිය විග්‍රහයන්හි දී නින්දිත ගැරහීම් එල්ල කරන මාධ්‍යවේදින් දෙදෙනෙකු සිටී. අයකු නම් සිය උදෑසන වැඩ සටහනෙහි දී ජාතියේ සතුරන් යැයි කියැවෙන පුද්ගලයින් නම් කර හෙළා දකිමින් උග්‍ර ප්‍රහාරයන්හි යෙදෙන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති හඩ්සන් සමරසිංහ ය. අයි.ටී.එන් රූපවාහිනී නාලිකාවේ දෛනික විග්‍රහයක් ඉදිරිපත් කරන දිනමිණ හිටපු කර්තෘ මහින්ද අබේසුන්දර ද එවැනිම චර්යාවකින් යුතු ය.

## පුවත් වෙබ් අඩවි මර්දනය

උක්ත කී මෙම තත්ත්වය ගැන ශ්‍රී ලංකාවේ පවත්නා තැති ගැන්වෙන සුළු තත්ත්වයක් නම් රාජ්‍ය පාලිත ගුවන් තරංග කළමනාකරණය පිළිබඳව ප්‍රශ්න කිරීමට ව්‍යවස්ථාමය අයිතියක් ඇති පාර්ලිමේන්තු විරුද්ධ පාර්ශවය නිහඬව

සිටීමට තීරණය කර තිබීම යි. පසුගිය සැප්තැම්බරයේ දී ජනමාධ්‍ය අමාත්‍යාංශය සම්බන්ධ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව රැස්වී පැය භාගයකට පසු විසිර ගියේ එහි සාමාජිකයින්ට න්‍යාය පත්‍රයක් ලබා නොදීම නිසා සාකච්ඡා කිරීමට මැයක් නොවූ බැවිනි.

තමන්ට මාධ්‍යයෙහි අල්ප ඉඩක් පමණක් ලැබෙන බැවින් මාධ්‍ය නිදහස උදෙසා නැගී සිටීමට තමන්ට බැඳීමක් නැතැයි විපක්ෂ නායකත්වය තර්ක කරයි. මෑත දී සියළු රාජ්‍ය ජනමාධ්‍ය වර්ජනය කරන්නැයි ඉල්ලා සිටි පාර්ලිමේන්තු විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ එමගින් විවේචන කැඳවා ගත්තේ ය. එම ස්ථාවරය තවදුරටත් ගෙන යමින් ඔහු කියා සිටියේ කිසිදු විවේචනයකින් තොරව වත්මන් රාජ්‍ය පාලනයේ ගිරවුන් බවට පත් ව සිටින සියළු ජනමාධ්‍ය වර්ජනය කළ යුතු බවයි. එහිලා ඔහු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි බසින් විකාශනයන් ඇති එක් මාධ්‍ය ආයතනයක් විශේෂ කොට සඳහන් කළේ ය. මෙම කුපිතකාරී ප්‍රකාශය ගැන ඔහු පසුතැවෙන්නේ නැත. ඔහු කියා සිටින්නේ දේශපාලන විරුද්ධ පාර්ශවය ආණ්ඩුකරණය යහපත් කිරීම සඳහා කළ හැකි සියල්ල කරමින් සිටින බවය. එසේ නමුත් පටු වාණිජ අවශ්‍යතාවයන් නිසා ජනමාධ්‍ය එයට ප්‍රචාරයක් ලබා දෙන්නේ නැති බව ය. ඔහු දක්වන පින්තූරයට අනුව ජනමාධ්‍ය කැමැත්තෙන් ම වත්මන් රිජිමයේ සහායකයකු බවට පත්ව සිටින අතර එහි සෑම රුචියකටම ආ වඩයි.

මෙම තත්ත්වයට මුහුණ දීම පිණිස විරුද්ධ පක්ෂ අන්තර් ජාල සම්පත් යොදා ගනිමින් ප්‍රතිචාර දක්වන බව පෙනෙන්නට තිබේ. එමෙන්ම මෑත මාසයන්හි දී ශ්‍රී ලංකාව පිළිබඳ අන්තර්ගතයන් ඇති වෙබ් අඩවි හිතුවක්කාර නීති වෙනස්කම් සහ නිරන්තර බාධාකිරීම්වලට මුහණ දී තිබේ. 2011 දෙසැම්බරයේ දී රටෙහි තොරතුරු ඇතුළත් සියළු වෙබ් අඩවි ලියා පදිංචි කළ යුතු යැයි ජනමාධ්‍ය අමාත්‍යාංශය නීතියක් පැනවීය. මූලික අයිතිවාසිකම් නීති යටතේ මෙම නියෝගයට අභියෝග කළ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ මූලික අයිතිවාසිකම් පෙත්සම, පෙත්සම්කරුවන්ට මෙම කාරණය සම්බන්ධයෙන් අදාළත්වයක් නැතැයි ද අදාළ වෙබ් අඩවි එම නියෝගයට අවනත වී ලියා පදිංචි වී ඇතැයි ද යන පදනම යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් බැහැර කරන ලදී.

ජූනි 29 දා කොළඹ නගරාරක්ෂක පොලීසිය ශ්‍රී ලංකා එක්ස් නිව්ස් සහ ශ්‍රී ලංකා මිරර් යන වෙබ් අඩවි දෙකෙහි කාර්යාලයන්ට කඩා පැන එහි සිටි කාර්ය මණ්ඩලය ද උපකරණ ද අත් අඩංගුවට ගන්නා ලදී. එදින උදෑසන එම වෙබ් අඩවි දෙක හවුලේ පාවිච්චි කළ කාර්යාලීය නිවහනට 25 දෙනෙකුගෙන් පමණ සමන්විත පොලිස් පිරිසක් ඇතුල් වූහ. කාර්යාලයට අගුළු දමා කාර්ය මණ්ඩලය තෙපැයක් පුරා එහි ඇතුළත රඳවා ගෙන ප්‍රශ්න කළ පොලීසිය පසුව ඔවුන්ව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූලස්ථානයට රැගෙන ගියේය. පුවත් වෙබ් අඩවි කාර්යාලයේ වූ පරිඝනක සහ අනෙක් උපකරණ ද පොලිස් බාරයට ගැනින.

එම අවස්ථාවේදී ම පොලීසිය ශ්‍රී ලංකා මිරර්හි හිටපු කර්තෘ සහ ඒ වන විට ශ්‍රී ලංකා එක්ස් නිව්ස්හි කර්තෘ ද වූ රුවන් පර්ඩිනැන්ඩස්ගේ නිවසට ද පැන පරීක්ෂා කළහ. පර්ඩිනැන්ඩස් මංගල සමරවීරගේ දේශපාලන සමීපතමයකු වන අතර ඔහුගේ සියළු වෙබ් අඩවි නමින් නැතත් ප්‍රධාන විපක්ෂය වූ එක්සත් ජාතික පක්ෂය සමඟ සම්බන්ධය. මෙම පොලිස් සෝදිසියට පෙරදා ශ්‍රී ලංකා

ආණ්ඩුව දෙමළ භාෂා වෙබ් අඩවි පහකට ප්‍රවිශ්‍යවීමේ අවකාශ වසා දමන ලෙස නියෝග කර තිබුණි. ඒවා නම් ටැමිල් වින්, අතිර්වු, සරිතන්, පොන්ගු තමිල් සහ පතිවු ය. ශ්‍රී ලංකාව සම්බන්ධ තොරතුරු අඩංගු සියළු වෙබ් අඩවි ලියා පදිංචි කරන සේ නියෝගය නිකුත් කළ 2011 නොවැම්බරයේ දී තහනම් කරන ලද වෙබ් අඩවි පහක් වූ අතර ඉන් එකක් වූයේ ශ්‍රී ලංකා මිරර් ය. පසුව එම තහංචිය ඉවත් කරන ලද්දේ ලියා පදිංචි කර නැති වෙබ් අඩවි වලට පුරුක් සම්බන්ධයක් නොදෙන බවට වූ පොරොන්දුවක් උඩය.

ජූනි 29 දා වෙබ් අඩවි මර්දනය සිදු වූයේ දේශපාලනික වශයෙන් සංවේදී නැගෙනහිර ද ඇතුළුව නව මැතිවරණ පැවැත්වීම පිණිස පළාත් සභා තුනක කවුන්සිල විසුරුවා හැරීමත් සමඟ ය. නිදහස් මාධ්‍ය මත කැරුනු මෙම පොලිස් සෝදිසි එකී පළාත්හි එලඹෙන මැතිවරණ සමයෙහි විවේචනාත්මක පුවත් මැඩලීමට දරන ලද ප්‍රයත්නයක් විය හැකි ය. පොලිස් කඩා පැනීමෙන් දෙසතියකට පසු ජනමාධ්‍ය අමාත්‍යාංශය නියෝගයක් නිකුත් කරමින් ලියා පදිංචි කිරීමේ අවශ්‍යතාවය යළි අවධාරණය කළේ වාර්ෂික ගාස්තුවක් ද නියම කරමිනි.

මෙම නියෝග අධිකරණමය සුපරීක්ෂාවකට බඳුන් වී නැත. පොලිස් කඩා පැනීමට ලක් වූ වෙබ් අඩවි හිමිකරුවන් විසින් පවරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සමක් සළකා බලන අතරතුර ලියා පදිංචිය සම්බන්ධයෙන් තමන් විසින් කලින් දෙන ලද තීන්දුවට වැරදි අර්ථ කථනයක් නොදෙන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය අනතුරු ඇඟවීය. එමෙන්ම අත් අඩංගුවට ගන්නා ලද පරිගණක දෙසතියක් ඇතුළත ආපසු බාරදෙන ලෙස ද එය නියෝග කළාය. මේ අතර අත් අඩංගුවට ගන්නා ලද වෙබ් අඩවි කාර්ය මණ්ඩල එක් දිනකට පසු කොළඹ මහේස්ත්‍රාත්වරයාගේ නියෝගය මත ඇප පිට නිදහස් කර තිබුණි. මෙම නඩු විභාගය ඇසී ගෙන යන අන්දම අනුව පැමිණිළි පාර්ශවය නඩුව දිගට ගෙන යෑමට උනන්දුවක් දක්වන්නේ නැතැයි සමරවීර කල්පනා කරයි. මන්ද යත් එය ඔවුන් දුෂ්කර තත්ත්වයකට පත් කළ හැකි බැවිනි. වෙබ් අඩවි සෝදිසි කිරීම පිණිස පොලීසිය වරෙන්තුව ලබා ගෙන ඇත්තේ ඒවා '' රාජකීය මහිමය'' කෙළෙසන්නේය යන චෝදනාව යටතේ වීම නිසා ශ්‍රේෂ්ඨාධිකරණය පැමිණිල්ල සම්බන්ධයෙන් ගරුසරුවක් නොපෙන්වන බව පෙනී ගොස් තිබේ.

වෙබ් අඩවි කාර්යාල පොලීසිය විසින් සෝදිසි කළ දිනයෙහි කාර්ය බහුල වාණිජ පෙදෙසෙක දී කුදලා සුදු වෑන් රථයක දා ගැනීමේ අරමුණින්දෝ ශ්‍රී ලංකා එක්ස් නිව්ස් වෙබ් අඩවියේ වාර්තාකාර ශාන්ත විජේසූරිය හඹා ආ මැරවැර පිරිසක් ඔහු වටකර ගත්හ. එම මැර කණ්ඩායමෙන් බේරී දිව ගොස් ජීවිතය බේරා ගැනීමට ඔහු සමත් විය. අසල්වැසි දකුණු ආසියා රටක සාපේක්ෂ ආරක්ෂාව කරා පලා යාමට පෙර එළඹුන දෙසතිය ඔහු ගත කළේ කොළඹ සහ අවට නිවෙස්හි සැඟවී සිටිමිනි.

මෙම පැහැර ගැනීමේ ප්‍රයත්නයට හේතු තවමත් අපැහැදිලි ය. එම සිදුවීමට පසු කොළඹ ජනමාධ්‍යයන්හි පළ වූ වාර්තා කියා සිටියේ විජේසූරිය විපාක්ෂික වෙබ් අඩවි පවත්වා ගෙන යන ආකාරය ගැන ඇතුළත තොරතුරු දන්නා අයකු බවයි.

# පුවත්පත් මණ්ඩලය යළි පිහිටුවීම

දීර්ඝ කාලයක් තිස්සේ අක්‍රීයව පැවැති පුවත්පත් මණ්ඩලය යළි පණගැන්වීම පිළිබඳව ද ශ්‍රී ලංකාවේ ජන මාධ්‍ය ප්‍රජාව කණස්සලු වෙති. මෙම පනතට දුෂ්ඨ වගන්ති කිහිපයක් ද ඇතුළත් ය. ඉන් එකක් නම් රටෙහි ක්‍රියාත්මක ඕනෑම නීතියක් කෙළෙසා ඇත යන චෝදනාව උඩ අපරාධ නීතිය යටතේ නඩු විභාග කිරීමට එයට ඇති බලය යි. දෙවසරකට පෙර එය යළි පිහිටුවන තැන් පටන් එය පැවැත ඇත්තේ නිද්‍රාශීලීව ය. ජනමාධ්‍යවේදීන් අතුරින් අධ්‍යක්ෂවරයකු පත් කිරීමට ජනාධිපතිවරයා ගත් උත්සාහයන් බොහෝ දෙනෙකු එකී ආරාධනය ප්‍රතික්ෂේප කිරිම නිසා අසාර්ථක විය. ආරියනන්ද දොඹගහවත්ත ඊට පත් කිරීමෙන් පසු සමීකරණය වෙනස් වු බව පෙනේ. මන්ද යත් යළි පණ ගන්වන ලද පුවත්පත් මණ්ඩලයට එක්වූ ප්‍රසිද්ධියක් ඇති ප්‍රථම ජනමාධ්‍යවේදීයා ඔහු වූ නිසා ය.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ව්‍යවසාය පිළිබඳ කමිටුව (කෝප්) මෑතදී පුවත්පත් මණ්ඩලය පවත්වාගෙන යෑමේ වැය සළකා බලා එය වසා දැමීමට යෝජනා කළේ ය. එසේ නමුත් ආණ්ඩුව ජනමාධ්‍ය අරභයා එමගින් පවත්වා ගත හැකි දණ්ඩන බලය නිසාම එම උපදේශය පිළිනොගන්නවා ඇත.

පුවත්පත් කර්මාන්තය විසින් පිහිටුවන ලද ස්වයං නියාමන යාන්ත්‍රණය වූ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිළි කොමිසම ජනමාධ්‍ය ප්‍රජාවෙහි විශ්වාසය තවදුරටත් භුක්ති විඳිමින් සිටී. එසේ නමුත් ඉදිරි දෙවසර තුළ විදේශාධාර නොලැබී යාමේ අනතුර මත එහි අදාළත්වය නැතිව යාමට ඉඩ තිබේ. 16දෙනෙකුගෙන් සමන්විත පූර්ණ කාලීන කාර්ය මණ්ඩලයක් සහිත පුවත්පත් මණ්ඩලයට සාපේක්ෂව සම්පත් ඌණ නමුත් පැමිණිළි නිලධාරීන් තිදෙනෙකු පමණක් ඇතිව කටයුතු කරන පැමිණිළි කොමිසම පුවත්පත් කර්මාන්තයේ විශ්වාසය ලබන නිසාම වඩා විශ්වසනීයත්වයක් පෙන්නුම් කරයි.

විශේෂයෙන්ම පශ්චාත් යුද්ධ සන්දර්භය තුළ වඩා තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කළ හැකි ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීහු අසමාන වැටුප් සහ රැකියා කොන්දේසිවලින් දිගටම පීඩා විඳිති. එමගින් ඔවුන්ගේ කැපවීම සහ උනන්දුව බාලවෙයි. තොරතුරු මූලාශ්‍ර මෙන්ම කොළඹ මාධ්‍යට පමණක් තොරතුරු සැපයිය යුතු යැයි කල්පනා කරන ආණ්ඩුවේ ආයතන නිසා ද ඔව්හු කොන්වී සිටිති. මෙම වෘත්තීය ජනමාධ්‍යවේ දී ප්‍රභේදයට තොරතුරු නිදහසේ නීතිය විශේෂයෙන් වැදගත් ය. මේ නිසාම උගත් පාඩම් කොමිසමේ එකී නිර්දේශය නිසි වගකීමකින් යුතුව ක්‍රියාත්මක කරන සේ ඉල්ලා සිටීමට මෙම පිරිසට විශේෂ හේතුවක් තිබේ.

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යයන්හි ඇති දුර්වල මුල්‍ය තත්ත්වය නිසා ඒවා වෙළඳ දැන්වීම් තෙරපුමට යටත්වීමට ඇති ඉඩ වැඩිය. වෙළඳ දැන්වීම් ක්ෂේත්‍රයෙහි ආණ්ඩුව සහ එහි ආයතන සතු මහ බලය විසින් මෙම තත්ත්වය කිසි ලෙසකින් සමහන් නොකරයි. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් කරන ලද මෑත සමීක්ෂනයකට අනුව රටෙහි සමස්ත වෙළඳ දැන්වීම් වැයෙන් සියයට 16ක් ම ඇත්තේ ආණ්ඩුවේ මූලාශ්‍රයන්ට ය. තවද මාධ්‍යයෙහි ආණ්ඩුව සතු පුළුල් හිමිකාරකම ද සළකන කල එහි වෙළඳ දැන්වීම් වැය ඊටත් වඩා එනම් සියයට 38ක් තරම් වෙයි. මෙම බල මුලාශ්‍රයට වත්මන් පාලනය විසින් බැංකු වැනි

පොදු ආයතන පවරා ගැනීමෙන් ලබා ගෙන ඇති බලපෑම ද එක් කළ යුතු ය. මේ හේතුව නිසා ජනමාධ්‍ය ආයතන ගණනාවකට ම ආණ්ඩුවේ නියෝගයන්ට යටත්වීමට සිදුව ඇති අතර ඉන් සමහරක් ඒ අනුව සිය කර්තෘ ධූරාවලියේ ඉහළම මට්ටම්හි පවා වෙනස්කම් සිදුකර තිබේ.

## කර්තෘවරුන් කැපීම සහ හැලීම

*සිලෝන් ටුඩේ* හි ප්‍රධාන කර්තෘවරයා වූ ලලිත් අලහකෝන් පසුගිය ජූනි මාසයේ දී හදිසියේ ම තනතුරින් ඉවත් කරන ලදී. හිමිකරුවන්ගේ මෙම හිතුවක්කාර තීරණයට එරෙහිව ඔහුගේ වෘත්තිය සගයින් හතර දෙනෙකු ද ඉල්ලා අස්වූහ. ඒ වන විටත් ප්‍රධාන කර්තෘවරයාගේ පරීක්ෂාව යටතේ කතුවරිය ලෙස කටයුතු කළ හනා ඊබ්‍රාහිම් වෙත සම්පූර්ණ කර්තෘ පාලනය පවරන ලදී. හනා ඉබ්‍රාහිම් විශේෂයෙන්ම ජාත්‍යන්තර මාධ්‍ය නිදහස් සංවිධාන සමඟ කටයුතු කිරීම ද ඇතුළුව වෘත්තීය පිළිගැනීමක් සහිත මාධ්‍යවේදිනියක වූ බැවින් මේ ප්‍රශ්නයේ දී ඇයට විරුද්ධව බොහෝ ප්‍රකාශ කෙරුනි.[6] ඇය නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කැදවුම්කාරිය ලෙසද දෙවසරක් කටයුතු කර තිබුණි.

දින ගණනාවකට පසු සිය වෘත්තීය හැකියාවන් යළි පෙළ ගස්වා ගැනීමට *සිලොන් ටුඩේ* ජනමාධ්‍යවේදීන්ට හැකි විය. මුහුණ දීමට සිදුවූ ව්‍යාකූලතාවයන් නොසළකා එම කර්තෘ මණ්ඩලය පවසන්නේ එම වෙනසට එකම හේතුව පුවත්පතෙහි අන්තර්ගතය දියුණු කිරීමට තිබූ අවශ්‍යතාවය පමණක් බවයි. ශ්‍රී ලංකාවෙහි මාධ්‍යවේදීන්ගේ සංවිධාන සිදුවීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට අකැමැත්තක් දක්වූ නමුත් සතියක් ගිය තැන *සිලෝන් ටුඩේ* කළමනාකරණ තීරණය හෙළා දකිමින් එතරම් ප්‍රබල නැති ස්ථාවරයක් ප්‍රකාශ කළේ ය.

*සිලොන් ටුඩේ* අයත් වන්නේ ව්‍යාපාරිකයකු වන ටිරාන් අලස්ටය. ඔහුට විවිධ ව්‍යාපාරයන් අයත් වන අතර දීර්ඝකාලීන දේශපාලන ක්‍රියාකාරිත්වයක් ද තිබේ.

කලකට පෙර මංගල සමරවීර සමඟ විපාක්ෂික දේශපාලනයේ යෙදී සිටි සහ 2012 ජනවාරි ජනාධිපතිවරණයේ දී හිටපු හමුදාපති සරත් පොන්සේකාගේ ජනාධිපති ධූර අපේක්ෂකත්වය ගොඩ නැගීමට ක්‍රියාකළ අලස් දැන් ඒ මාර්ගයෙන් ඉවත්ව තිබේ. මහින්ද රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ විසංවාදී කණ්ඩායමක් මෙහෙයවූ මංගල සමරවීර දැන් සිය කණ්ඩායම රනිල් වික්‍රමසිංහගේ එක්සත් ජාතික පක්ෂයට අනුබද්ධ කොට ප්‍රධාන විපක්ෂයේ හවුල්කරුවකු බවට පත් විය. මෙම සැළැස්මෙන් ඉවතට ගිය අලස් විපක්ෂයේ ම කොටසක් වූ, එසේ නමුත් එක්සත් ජාතික පක්ෂය විසින් රාජපක්ෂ රිජීමයේ උපක්‍රමික හවුල්කරුවකු ලෙස කල්පනා කරන, දේශපාලන සංවිධානයක් ඇතිව ෆොන්සේකා කෙරෙහි විශ්වාසයෙන් පසුවිය.

[6] "Freedom in Solidarity: Media Working for Peace in South Asia" නම් 2010 දකුණු ආසියාව පිළිබඳ අයි.එෆ්.ජේ. ප්‍රකාශණයෙහි හනා ඊබ්‍රාහිම්ගේ දායකත්වය පැහැදිලිව සටහන් කොට තිබේ. එම වාර්තාව සඳහා පිවිසෙන්න: http://asiapacific.ifj.org/assets/docs/021/100/f7cf615-b115064.pdf. පශ්චාත් යුද්ධ ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ අනුගමනය කළ උපායමාර්ගයක් ලෙස ප්‍රසිද්දියේ සඳහන් කොට නැති අනෙක් දායකත්වයන් ද වෙති.

මාධ්‍ය හිමිකාරකම සහ දේශපාලන ක්‍රියාකාරිත්වයේ මෙම මුහුවීම ජනමාධ්‍ය ප්‍රජාවට ද සම්ප්‍රේෂණය වී එකී ශ්‍රේණීන් අතර බරපතල බෙදීම් වලට හේතු වී තිබේ. ජූලි 08 දා *සිලෝන් ටුඩේ* '' මාධ්‍ය නිදහස දූෂ්‍ය කළ විට'' යනුවෙන් කතුවැකියක් පළ කළේ ය. එහි කතුවරිය වූයේ හනා ඊබ්‍රාහිම් වූ බැවින් මෙම කතුවැකියේ අන්තර්ගතයත් ස්වරයත් පහසුවෙන් ම සහ නිවැරදිව ඇයට පැවරුනි. දේශපාලන විරුද්ධ පක්ෂය සමඟ බැඳී තිබූ වෙබ් අඩවි දෙකක් ජූනි 29 දා පොලීසිය විසින් වටලා සෝදිසි කිරීම සම්බන්ධයෙන් එය මෙසේ ලියා තිබුණිඃ

> *''... ආණ්ඩුවේ ක්‍රියාව සහමුලින්ම හෙළා දක ඊට ආවරණයවීම ලෙහෙසි ය. එනමුත් කනස්සළු සහගත යතාර්ථය නම් අන්තර්ජාල මාධ්‍යයේ සෑහෙන ප්‍රමාණයක් අනෙක් අයට රිදවීම, අවලාද නැගීම සහ අපහාස කිරීම පිණිස මාධ්‍ය නිදහසේ ආවරණය යොදා ගන්නා බවයි. අන්තර්ජාල, මුද්‍රිත හෝ රූපවාහිනී යන කවර මාධ්‍යයක් හෝ තමන්ට ගරුත්වයක් අපේක්ෂා කරන්නේ නම් මාධ්‍ය නිදහස යනු අයිතියකට වඩා වගකීමක් බව පිළිගත යුතු ය. ... එය විසින් ඉල්ලා සිටින්නේ අප ආචාර ධර්ම පද්ධතියකට බැඳී සිටිය යුතු බවයි. එම වගකීම විසින් ඉල්ලා සිටින්නේ අප පළ කරන හෝ විකාශණය කරන පුවත් අගතියෙන් තොර සහ අපක්ෂපාතී විකෘතියෙන් තොර එමෙන්ම අවලාද ව්‍යාපාරයක කොටසක් නොවන බවත් ය. .. අවාසනාවකට මෙන් මේ වනාහී අන්තර්ජාල ජනමාධ්‍යයේ දක්නට නැති වගකීමකි. විසංවාදයට ඇති අවකාශය සීඝ්‍රයෙන් සීමාවෙමින් ඇති සහ ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය නිරන්තර තෙරපුමකට ලක්ව ඇති තත්ත්වයක් තුළ අන්තර් ජාල ජනමාධ්‍ය ප්‍රධාන ධාරාව සොයා නොබලන පුවත් සොයා යාම මගින් වැඩි වැදගත්කමක් අල්ලා ගනී. මෙම සන්දර්භය තුළ අන්තර්ජාල ජනමාධ්‍ය විසින් මාධ්‍ය නිදහස කෙළෙසීම ජනතාවගේ අපේක්ෂා අහෝසි කිරීමක් පමණක් නොව එමගින් මාධ්‍යයෙන් සමස්ත ලෙස පළිගැනීම සඳහා රජයට ආයුධ සපයා දීම මගින් මහත් අනතුරක් ද ඇති කරයි. කිසිදු රජයක් සම්පූර්ණ අන්තර්ජාල නිදහසට කැමැති නැත. බොහෝ රාජ්‍ය මාධ්‍ය නිදහස සහ නිදහසේ තොරතුරු ලබා ගැනීමේ අයිතිය අතර සමතුලනයක් ඇති කිරීම අභියෝගයක් ලෙස සළකයි. එසේ නමුත් අන්තර්ජාල මාධ්‍ය ක්‍රියා කර ඇති වගකීමක් නැති ආකාරය අන්තර් ජාල විසංවාදයන් මැඩලීම සාධාරණය කිරීමට රජයට අවස්ථාවක් සපයන අතර ජන මාධ්‍ය යටපත් කර ගැනීම තවදුරටත් පහසු කරයි. ... තමන් භුක්ති විඳින නිදහස වගකීමක් ලෙස පිළිගැනීමත් වටිනාකමක් ඇති ජනමාධ්‍ය භාවිතයක යෙදීමත් අන්තර්ජාල හෝ අනෙක් හෝ සියළු ජනමාධ්‍යවේදීන්ට වැදගත් වන්නේ එහෙයිනි. ''*

ජනමාධ්‍ය නිදහස සම්බන්ධයෙන් වැඩ කිරීමේ ඊබ්‍රාහිම්ගේ අතීතය නොසළකා මෙම කතුවැකිය විපාක්ෂික ජනමාධ්‍යයන්හි මහත් විරුද්ධත්වයකට හේතු විය. ජනමාධ්‍යවේදීන් සුරකීමේ කමිටුවේ (සීපීජේ) ආසියා සම්බන්ධීකාරකවරයාට ලිපියක් යවමින් සමරවීර ''නිෂේධාත්මක, උසිගන්වන සුළු සහ දොස් සහිත වාර්තාකරණය'' සම්බන්ධයෙන් ඊබ්‍රාහිම්ට චෝදනා කළේ ය.

ඊබ්‍රාහිම්ගේ කර්තෘත්වය යටතේ *සිලොන් ටුඩේ* පුවත්පත සහ ඊට අනුබද්ධ මව්බිම සිංහල පුවත්පත '' වෙබ් අඩවි තහනම් කිරීමේ ශ්‍රී ලංකා ආණ්ඩුවේ නීති

විරෝධී පියවර ආරක්ෂා කිරීම පිණිස වාර්තාකරණයේ සීමාවන් ඉක්මවා යමින් සහ ප්‍රයෝගික වශයෙන් එම වෙබ් අඩවි ජනමාධ්‍යවේදීන්ට සහ පරිපාලකයින්ට එරෙහි වැඩිදුර ප්‍රහාරයන් කුළුගන්වන බැලමෙහවරකාරී ස්ථාවරයක් රැගෙන ඇත'' යි සමරවීර චෝදනා කළේ ය. මෙම පුවත්පත් දෙක ''වෙබ් අඩවි කාර්යාලයන්ට කෙරුනු පොලිස් මෙහෙයුම පිළිබඳව කනස්සල්ල පළ කරමින් අන්තර් ජාතික සංවිධාන සහ එක්සත් ජාතීන් විසින් නිකුත් කරන ලද එකද ප්‍රකාශයක්වත් මුද්‍රිත පුවත්පත්හි පළ නොකළේ ය''යැයි ද සමරවීර චෝදනා කළේ ය.

අවංකව කතා කරන අවස්ථාවන්හි දී ශ්‍රී ලංකාවේ නිදහස් ජනමාධ්‍යවේදීහු විපාක්ෂික වෙබ් අඩවි වල පළ වන බොහෝ වාර්තා වෘත්තීය මට්ටමට නැතැයි එකඟ වෙති. එසේ නමුත් සමරවීර විශ්වාස කරන්නේ මෙම වෙබ් අඩවිවල තත්ත්වය රාජ්‍ය මාධ්‍යයන්ට වඩා බොහෝ ඉහළින් ඇති බවයි. එම කියමන සමඟ එකඟ නොවන අයෙක් නැති තරම් ය. මෙම ආචාර ධර්මීය ගැටළුව විසින් යළි පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය මාධ්‍ය මහජන සේවා මාධ්‍ය බවට පරිවර්තනය කළ යුතුය යන දිගු කලක් පුරා අයි.එෆ්.ජේ. විසින් කරමින් ඇති අවධාරණයයි.

*සන්ඬේ ලීඩර්* ආයතනය මගින් සිංහල බසින් පළ කරන සති අන්ත *ඉරුදින* පුවත් පතෙහි නියෝජ්‍ය කර්තෘ ලෙස සේවය කළ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ ක්‍රියාකාරිකයකු වන සුනිල් ජයසේකර පුවත්පත් ආයතනය මුහුණ දෙමින් සිටි මුල්‍යමය අමාරුකම්හි විපාකයක් වශයෙන් මාස ගණනාවක් වැටුප් නැතිව සේවය කරමින් සිටියේ ය. ඔහු ආයතනයට කැපවීමෙන් සේවය කරමින් සිටි නමුත් 2012 ජූලි මාසයේ දී ඔහුගේ සේවය තවදුරටත් අවශ්‍ය නැතැයි ආයතනයේ සභාපති ඔහුට දැන්විය. ඔහුගේ සේවය අහෝසි කිරීම එම කාලයෙහි *සන්ඬේ ලීඩර්* පුවත්පතෙහි නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට එරෙහිව පළ වූ ලිපිවලට සම්බන්ධයක් ඇත්දැයි පැහැදිළි නැත.

*සන්ඬේ ලීඩර්* පුවත් පතෙහි කර්තෘ වූ ෆෙඩ්රිකා ජැන්ස්ට සැප්තැම්බර් මාසයේ දී සිය ධුරයෙන් ඉවත් වීමට බල කෙරුණි. ඒ පුවත්පතෙහි හිමිකාරත්වය කොටස් වෙළඳ පොළෙහි ව්‍යාපාරිකයකු අතට මාරු වී මාස කිහිපයකට පසු ය. දැන් *සන්ඬේ ලීඩර්*හි බහුතර කොටස් හිමිකරුවන අසංග සෙනවිරත්න කියන්නේ තමා ඉදිරිපත් වූයේ *සන්ඬේ ලීඩර්* මුහුණ දී සිටි දුෂ්කර මුල්‍යමය තත්ත්වයෙන් එය ගොඩ ගැනීමට පමණක් බවය. ඔහු ආයෝජකයකු ලෙස ඇතුල් කර ගැනීමට මූලිකත්වය ගත් ජැන්ස්ට එම ගනුදෙනුවේ කොටසක් ලෙස සැහෙන මුදලක් ද ලබා දෙන ලදී. කර්තෘ පරිපාලනය වෙනස් කිරීමට සෙනවිරත්න තීරණය කළ විට සේවය අහෝසි කිරීමේ වන්දිය ලෙස එකඟවූ මුදලක් ද ඇයට ගෙවන ලදී.

එසේ වෙතත් ඊට හේතුව ලෙස ප්‍රසිද්ධියට පත් වූ කාරණය වන්නේ පාලක වරප්‍රසාද විශේෂයෙන්ම ජනාධිපති රාජපක්ෂගේ තවත් සහෝදරයකු වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ විවේචනය කිරීම ය. මෙම ඉතිහාසය *සන්ඬේ ලීඩර්*හි ලසන්ත වික්‍රමතුංග කර්තෘත්වය දැරූ කාලය දක්වා දිව යයි. ඔහු ගෝඨාභය රාජපක්ෂගේ පරීක්ෂාව යටතේ ආරක්ෂක උපකරණ ගෙන්වීමේ දී මහා පරිමාණ දූෂණ සිදු වූ බවට ලිපි පෙළක් පළ කළේ ය. 2010 ජනවාරි ජනාධිපතිවරණය අවස්ථාවෙහි දී අන්තර් ජාතික මැදිහත්කරුවන් විසින් කරන

ලද වෙහෙසකර සාකච්ජාවටයකින් පසු සුදු කොඩි රැගෙන බාර වූ එල්ටීටීඊ නායකයින් එක එල්ලේ වෙඩි තබා ඝාතනය කරන ලද්දේ ගෝඨාභය රාජපක්ෂ ගේ ඍජු නියෝග මතයැයි එය ප්‍රධාන පුවතක් පළ කළේ ය. එම පුවතෙහි ෆොන්සේකා එය කී බවට උපුටා දක්වා තිබුණ ද වාර්තාව කියවන විට පෙනී යන්නේ ඔහු යුද හමුදාව සමග ප්‍රදේශයේ සිටිමින් වාර්තාකරණයේ යෙදුණ ජනමාධ්‍යවේදියකුගෙන් ලද තොරතුරු මත එය ප්‍රකාශ කළ බවයි. පශ්චාත් යුද්ධ ජයග්‍රාහී මානසිකත්වය තුළ මෙම ප්‍රකාශය ෆොන්සේකාට ඇදීම නිසා ඔහුගේ ජනාධිපතිවරණ අපේක්ෂකත්වය මහත් පසුබෑමකට ලක් විය. රාජපක්ෂ පවුල 2010 ජනාධිපතිවරණයෙන් පහසු ජයක් ලද නමුත් හිටපු යුද හමුදාපතිවරයාට එරෙහිව පළිගැනීම පාලක පවුල දිගටම කරගෙන ගියේ ය. ඉක්මනින්ම අත් අඩංගුවට ගැණුන ඔහුට චෝදනා ගණනාවක් උඩ නඩු පවරන ලදී.

'සුදු කොඩි නඩුව' යැයි ව්‍යවහාරයට පත් ෆොන්සේකාට එරෙහි යුද හමුදා නීතිය යටතේ පවරන ලද නඩුවෙහි දී ජැන්ස් පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි කූඩුවට නැග විස්තරාත්මක සාක්ෂියක් දුන්නා ය.

තමන්ගේම නමින් තම කර්තෘත්වය ඇති පුවත්පතක පළ කරන ලද පුවතක මූලාශ්‍රයට එරෙහිව කර්තෘවරයකු සාක්ෂිදීම පිළිබඳව ප්‍රශ්න මතු කළ හැකිය. ෆොන්සේකා විසින් 'සුදු කොඩි' හෙළිදරව් කිරීම කළ සාකච්ජාවේ සටහන් අඩංගු සිය සටහන් පොත අධිකරණයට බාර දීම මගින් හිටපු යුද හමුදාපතිවරයාට එරෙහි නඩුව සනාථ කිරීමට ජැන්ස් උත්සුක විය. ඒ අනුව 2011 නොවැම්බර් මාසයේ දී ෆොන්සේකා, යුද හමුදා ශ්‍රේණීන් අතර නොමනාපය ඇති කිරීම සහ ''අණදීමේ පරිපාටිය'' පිළිබඳ මූලධර්ම කෙළෙසීම සම්බන්ධයෙන් යුද හමුදා පනත යටතේ වරදකරු කරන ලදී.[7]

ස්විස්ටර්ලන්තයෙන් සුරතල් බලුපැටියකු ගෙන්වා ගැනීම පිණිස පවුලේ ඥාතියකු ගුවන් නියමුවා ලෙස අනුයුක්ත පිණිස ගුවන් ගමන් කාල සටහනෙහි රාජකාරි ලේඛනය වෙනස් කර ඇතැයි ලද තොරතුර සැබෑදැයි විමසා බැලීම පිණිස ජැන්ස් 2012 ජනවාරියේ දී ආරක්ෂක ලේකම්වරයාට කතා කළේ ය. මෙහි තිබූ මහජන ලැදියා කෝණය වූයේ ආරක්ෂක ලේකම්වරයාගේ සුරතල් බලු පැටියා රැගෙන ඒම බාර දෙන ලද ගුවන් නියමුවාට එම ගමනාන්තය කරා සාමාන්‍යයෙන් පියාසර කරන විශාල ගුවන් යානා පැදවීමට අවසරයක් නොතිබූ බැවින් ගුවන් මගීන් විසි දෙනෙකුගේ ස්ථිර කොට තිබූ ගමන් අවලංගු කිරීමට සිදුව තිබීම යි. ගුවන් යානා සමාගමෙහි ජ්‍යෙෂ්ඨ නියමුවන් විරුද්ධත්වය පළ කිරීමෙන් පසු රාජකාරි ලේඛනය වෙනස් කිරීම අත්හිටවන ලදී. ආරක්ෂක ලේකම්වරයාට ජැන්ස් දුන් දුරකථන ඇමැතුම වහාම නපුරු රොස් පරොස් කියා ගැනීමක් බවට පත් විය. දින කිහිපයකට පසු ජැන්ස් ආරක්ෂක ලේකම්වරයාට තවත් දුර කථන ඇමතුමක් දෙමින් කියා සිටියේ කරුණු පිළිබඳ ප්‍රශ්නයක් නැතත් *සන්ඩේ ලීඩර්* එම පුවත පළ නොකරන බව ය. නැවත වතාවක් ආරක්ෂක ලේකම්වරයාට යකා නැග අසීමිත අක්‍රෝශ පරිභව කිරීමක

---

[7] මෙය හිටපු හමුදාපතිවරයා වරදකරු කරමින් දෙන ලද තීන්දු ගණනාවකින් එකක් පමණි. ශ්‍රී ලංකා විදේශ ඇමැතිවරයා සහ ඇමෙරිකානු රාජ්‍ය ලේකම්වරිය අතර පැවැති සාකච්ජාවකින් අනතුරුව 2012 මැයි මාසයේ දී ඔහුට ජනාධිපති සමාවක් දෙන ලදී. එසේ නමුත් ශ්‍රී ලංකා ආණ්ඩුවේ මතය වන්නේ එම තීරණය කිසිදු බාහිර බලපෑමකින් තොරව ස්වාධීනව ගන්නා ලද එකක් බවයි.

යෙදුනි. මෙම දුරකතන ඇමැතුම් දෙකෙහිම පිටපත් *සන්ඩේ ලීඩර්* හි සිය මුල් පිටුවෙහි කැපී පෙනෙන ලෙස පළ කරන ලදී. ඉන් මහත් මහජන විරෝධයක් ඇති විය.

මෙම වාර්තාව සකස් කෙරෙමින් පවතින අතරතුර වාර්තා වූයේ ආරක්ෂක ලේකම්වරයා අපකීර්තියට පත් කළේ යැයි එකී පුවත වෙනුවෙන් සමාව අයැදීමක් පළ කරන සේ පුවත්පත් මණ්ඩලය විසින් දෙන ලද නියෝගයක් සන්ඩේ ලීඩර් පුවත්පත පිළිගත් බවයි. මෙම පුවත සැබෑවක් නම් මෙය වනාහී යළි ස්ථාපනය කරන ලද පුවත්පත් මණ්ඩලය විසින් සිය අධිකාරිය භාවිත කළ ප්‍රථම අවස්ථාව ය. එය විසින් ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසට දීර්ඝ කාලීන විපාක ඇති කරනු නියතය.

එය විසින් ඇතිකළ හැකි අනතුර පිළිබඳව අවබෝධය ඇතිව ශ්‍රී ලංකාවේ මාධ්‍ය ප්‍රජාව ජනමාධ්‍ය කර්මාන්තය විසින් පිහිටා ඇති ස්වයං නියාමන යාන්ත්‍රණය වන ශ්‍රී ලංකා පුවත් පත් පැමිණිලි කොමිසම කෙරෙහි සිය කැපවීම යළි සහතික කර සිටිති. මෙම ආයතනය විදේශාධාර අවසන්වීම හේතු කොට ගෙන අහෝසි වී යාමේ තර්ජනයට මුහුණ දී සිටින ආයතනයකි. කෙසේ වෙතත් එහි පරිපාලනය භාරව සිටින ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සිය වැදගත්කම අලුත්කර ගනිමින් පැමිණිලි කොමිසම දිගටම පවතිනු ඇතැයි විශ්වාසය පළ කරයි. සැළැස්ම වන්නේ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය අවශ්‍ය සුදුසුකම් සපුරා ගනිමින් විශ්වසනීය අන්තර් ජාතික ජනමාධ්‍ය පුහුණු ආයතනයක් බවට පත් කිරීම ය. එසේ නමුත් මෙම සැළැස්ම සාර්ථක වනු ඇත්තේ ජනමාධ්‍ය කර්මාන්තයේ මෙන්ම පුළුල් සිවිල් සමාජයේ ද පූර්ණ දායකත්වය ලදොත් පමණි. එසේ නොවුවහොත් විකල්පය විය හැක්කේ පැමිණිලි කොමිසමත් සමඟම මාධ්‍ය නිදහස දියව යැමත් ජාතික ප්‍රතිසන්ධානයක සියළු යතාර්ථවාදී අපේක්ෂා පහව යැමත් ය.

## ස්තුතියඃ

මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ සිය පාර්ශ්වකරුවන් සමඟ අයි.එෆ්.ජේ. හි අනවරත සංවාදයේ ප්‍රතිඵලයකි. අයි.එෆ්.ජේ. ආසියානු සම්බන්ධිකාරක සුකුමාර් මුරලිදරන් 2012 සැප්තැම්බර් අගදී මෙම වාර්තාවට තොරතුරු එක් කරනු පිණිස ශ්‍රී ලංකාවෙහි සංචාරය කළේ ය. මෙම දූත මෙහෙවර සම්බන්ධීකරණය කරමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ සුනිල් ජයසේකර සහ ශාමිනී බොයිල් විසින් දරන ලද ප්‍රයත්නයන් ස්තුති පූර්වකව සඳහන් කරමු. ඊට අමතරව පහත සඳහන් පුද්ගලයියෝ සහ ආයතන ද ඔවුන්ගේ විග්‍රහ සහ තොරතුරු සැපයීම මගින් මහත් දායකත්වයක් ලබා දුන්හඃ

- දිල්රුක්ෂි හඳුන්නෙත්ති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කර්තෘ, සිලෝන් ටුඩේ
- හනා ඊබ්‍රාහිම්, කර්තෘ , සිලෝන් ටුඩේ
- ඉම්රාන් පුර්කන්, ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
- ජේ.සී. වැළිඅමුන, නීතිවේදී සහ මානව හිමිකම් ක්‍රියාකාරික
- කමල් ලියනාරච්චි, ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
- කුමාර් නඩේසන්, සභාපති, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය

- ලසන්ත රුහුණගේ, ශ්‍රී ලංකා ජනමාධ්‍යවේදීන්ගේ සංගමය
- මංගල සමරවීර, පා.ම. එක්සත් ජාතික පක්ෂය
- එම්.ටී.එම්.මුසාමිල්, ශ්‍රී ලංකා මුස්ලිම් ජනමාධ්‍යවේදීන්ගේ සංසදය
- එන්.එම්.අමීන්, කර්තෘ , නවමනී සහ කැදවුම්කරු, ශ්‍රී ලංකා මුස්ලිම් ජනමාධ්‍යවේදීන්ගේ සංසදය
- රංග ජයසූරිය, ශ්‍රී ලංකා ජනමාධ්‍යවේදීන්ගේ සංගමය
- රනිල් වික්‍රමසිංහ, පා.ම. එක්සත් ජාතික පක්ෂය
- රුකී ප්‍රනාන්දු, මානව හිමිකම් ක්‍රියාකරු
- සන්ජන හත්තොටුව, කර්තෘ , ග්‍රවුන්ඩ්ස් විව්ස්
- ෂාන් විජේතුංග, ට්‍රාන්ස්ෆරන්සි ඉන්ටර්නැෂනල්
- ටී. ප්‍රේමනන්තන්, කර්තෘ , උදයන්
- තිලංග සුමතිපාල, සභාපති, ලක්බිම සමූහය,
- උයද කළුපතිරන, මානව හිමිකම් ක්‍රියාකරු, ඉන්ෆෝම්
- විලියම් සුකුමාර් රොක්වුඩ්, ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම